# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/26 - 2011 ජුනි 24 වැනි සිකුරාදා - 2011.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 2009 අංක 06 දරන උතුරු මැද පළාත් පාරිසරික ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ xvii (අ) වගන්තිය යටතේ ස්ථාපිත පළාත් සභාවලට බලය ලබා දුන් 9 වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව) අංක 3 අයිතමය යටතේ වූ සීමාවන්ට යටත්ව පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම පිණිස, ඉහත සඳහන් ප්‍රඥප්ති කෙටුම්පත 2011 මාර්තු මස 08 වැනි දින පැවැත් වූ පළාත් සභා රැස්වීමේ දී 2009 අංක 06 දරන පරිසර ප්‍රඥප්ති කෙටුම්පත සම්මත වූ බව මෙයින් සහතික කරමි.

පී. බී. දිසානායක,
සභාපති,
උතුරු මැද පළාත් සභාව.

2011 අප්‍රේල් මස 04 වැනි දින.

වර්ෂ 2011 වූ ජුනි මස 03 වැනි දින මා විසින් සහතිකය සටහන් කරන ලදී.

කරුණාරත්න දිවුල්ගනේ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

### උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2009 අංක 06 දරන උතුරු මැද පළාත් පාරිසරික ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ xvii (ආ) පරිච්ඡේදයේ 154 (අ) වගන්තිය යටතේ ස්ථාපිත පළාත් සභාවලට බලය ලබා දුන් 9 වන උපලේඛනයේ 1 වැනි ලයිස්තුවේ (පළාත් සභා ලයිස්තුව) අංක 37 අයිතමය යටතේ වූ සීමාවන්ට යටත්ව පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව වෙත ලැබී ඇති බලය ප්‍රකාරව උතුරු මැද පළාතේ පාරිසරික අධිකාරියක් පිහිටුවීම සඳහා ද, එම අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද, පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ අභිවර්ධනය කිරීම සඳහා ද, පරිසරයේ තත්ත්වය විධිමත් කිරීම, පවත්වාගෙන යාම සහ එය පාලනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තිය යි. (1980 ජාතික පරිසර පනත සමග අනනුකූලව මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ.)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

01. මෙම ප්‍රඥප්තිය 2009 අංක 06 දරන උතුරු මැද පළාත් පාරිසරික ප්‍රඥප්තිය යනුවෙන් මෙම ප්‍රඥප්තිය හඳුන්වනු ලැබේ. මෙය උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

### 1 කොටස

### උතුරු මැද පළාත් පාරිසරික අධිකාරියක් පිහිටුවීම

පළාත් අධිකාරියක් පිහිටුවීම.

02. 1. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා "උතුරු මැද පළාත් පාරිසරික අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවිය යුතුය. එය "පළාත් පාරිසරික අධිකාරිය" යන ලුහුඬු නාමයෙන් මෙහි මින්මතු හඳුන්වනු ලැබේ.

2. පළමු වැනි උප වගන්තිය යටතේ පිහිටුවන ලබන මෙම පළාත් පාරිසරික අධිකාරිය 3 වගන්තියේ පළමු වැනි උප වගන්තිය යටතේ තත්කාලීන සාමාජිකයින් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

3. පළාත් පාරිසරික අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් ඇති ඒකාබද්ධ මණ්ඩලයක් වන අතර එම නමින් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබිය හැකිය.

පළාත් පාරිසරික අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ලේකම්

03. 1. විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන අයගෙන් සමන්විත සාමාජිකයින් එකොළොස් දෙනෙකු (11) ගෙන් පළාත් පාරිසරික අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ :

(අ) පරිසරය, නීතිය, කලමනාකරණය, සැලසුම්කරණය, පරිපාලනය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති පුද්ගලයන් පස් දෙනෙක් ද,

(ආ) සෙසු සාමාජිකයින් අතුරින් එක් තැනැත්තෙකු ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,

(ඇ) එක් තැනැත්තෙකු පළාත් පරිසර විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.,

(ඈ) එක් තැනැත්තෙකු පළාත් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.,

(ඉ) එක් තැනැත්තෙකු උතුරු මැද පළාත් නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකුගෙන් ද සමන්විත විය යුතුය,

(ඊ) මෙම අධ්‍යක්ෂවරුන් අතුරින් එක් අයෙකු උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,

(උ) මෙම අධ්‍යක්ෂවරුන් අතුරින් එක් අයෙකු උතුරු මැද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු,.

(ඌ) මෙම අධ්‍යක්ෂවරුන් අතුරින් එක් අයෙකු පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් පළාත් අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. පළාත් අධිකාරියේ සභාපතිවරයා පත්කිරීම.

(එ) මෙම අධ්‍යක්ෂවරුන් අතුරින් එක් අයෙකු පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් පළාත් පරිසර අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ ලෙස පත් කරනු ලැබේ. පළාත් අධිකාරියේ ක්‍රියාකාරී. අධ්‍යක්‍ෂකවරයා පත්කිරීම

(ඒ) රෝගාතුර වීම් නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පළාත් අධිකාරියේ සභාපතිවරයා ඔහුගේ ධුරයේ කාර්යය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක,සභාපතිවරයා ලෙස වැඩ බැලීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අයෙක් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

2. පළාත් අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින පළාත් අධිකාරියේ සෑම රැස්වීමක ම, ඔහු මූලාසනය දැරිය යුතු ය. පළාත් අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, එවිට පැමිණි සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත්කර ගන්නා යම් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

3. රැස්වීම් සඳහා අවම වශයෙන් මසකට වරක්වත් පළාත් පාරිසරික අධිකාරිය රැස්විය යුතු ය.

4. පළාත් අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන සභාපතිවරයාට හෝ අධ්‍යක්ෂකවරයාට, ඔහුගේ ඡන්දයට අතිරේක ව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

5. විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි පළාත් අධිකාරියේ සභාපතිවරයා විසින් එහි ලේකම්වරයා වශයෙන් මෙම ප්‍රඥප්තියේ විධි විධාන පරිදි පත් කරගනු ලබන සාමාන්‍යාධිකාරි වරයා හෝ ඔහුගේ කාර්ය භාරය දරන නිලධාරියා පත්කළ යුතු ය. පළාත් අධිකාරියේ ලේකම්වරයා පත්කිරීම.

6. පළාත් අධිකාරියේ රැස්වීමක, ගණපූර්ණය සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. පළාත් පාරිසරික අධිකාරියේ රැස්වීමක ගණපූරණය.

7. පළාත් පරිසර අධිකාරියේ සමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, එය නොතකා පළාත් පරිසර අධිකාරියට ක්‍රියා කළ හැකි අතර, අධිකාරියේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයෙකු පත්කිරීමේ නැතහොත් නම් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුවෙන් පමණක් පළාත් අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් හෝ නිර්බල නොවන්නේය. නිර්බල සේ නොසැලකිය යුත්තේය.

8. පළාත් පාරිසරික අධිකාරියේ සභාපතිවරයාට ක්‍රියාකාරී අධ්‍යක්‍ෂවරයාට හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ යම් අධ්‍යක්‍ෂවරයෙකුට හෝ ලේකම්වරයාට හෝ විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික දීමනා සහ වෙනත් වියදම් පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩලයට හා ලේකම්වරයාගේ දීමනා.

9. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව, පළාත් අධිකාරියේ රැස්වීම් වලට සම්බන්ධ ව සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යායුතු ආකාරය සම්බන්ධ කාර්ය විධානයට අදාළව පළාත් අධිකාරිය විසින් කාර්ය පටිපාටිය සෑදිය යුතු ය. රැස්වීම් කාර්ය පටිපාටිය.

04\. 1. පළාත් අධිකාරියේ මුද්‍රාව එහි ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය. පළාත් පාරිසරික අධිකාරියේ මුද්‍රාව.

2. පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට පළාත් අධිකාරියේ මුද්‍රාව සකස් කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි ය.

3. පළාත් අධිකාරියේ සභාපතිවරයා හෝ සාමාජිකයෙකු හෝ ඉදිරිපිටදී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට පළාත් අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් සභාපතිවරයා හෝ පැමිණ සිටි සාමාජිකයා හෝ විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන තැබිය යුතු ය.

පළාත් පාරිසරික අධිකාරියේ අරමුදල

05. 1. පළාත් අධිකාරියට අධිකාරිය සතු අරමුදලක් තිබිය යුතු ය. එම අරමුදලට;

(අ) උතුරු මැද පළාත් සභාව විසින් පාරිසරික කාර්යයන් සඳහා සම්මත කරනු ලබන හෝ පවරා දෙනු ලබන සියලුම මුදල් ;

(ආ) පළාත් පාරිසරික අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී කාර්යයන් ඉටු කිරීමේදී පළාත් අධිකාරිය වෙත ලැබෙන සියලුම මුදල් ;

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ අනුමැතිය මත ශ්‍රී ලංකාවෙන් බැහැර කවර හෝ ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා ණය, පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලුම මුදල් ;

(ඈ) පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී දඩ වශයෙන් හෝ ගාස්තු වශයෙන් හෝ අය කර ගනු ලබන සියලුම මුදල් ;

(ඉ) රජයෙන් හෝ මධ්‍යම පරිසර අධිකාරියෙන් හෝ වෙනත් රාජ්‍ය ආයතනයකින් ලැබෙන මුදල් සහ;

(ඊ) දේශීය හෝ විදේශීය වෙනත් ත්‍යාග හා පරිත්‍යාග හා ලැබීම් බැර කරනු ලැබිය යුතු ය.

2. පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් අධිකාරිය විසින් දැරිය යුතු යම් වියදමක් හෝ ගෙවීමක් හෝ පළාත් අධිකාරියේ අරමුදලින් දැරිය යුතු ය.

3. පළාත් අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් පනස් ලක්ෂයක් විය යුතු අතර, එය උතුරු මැද පළාත් සභා අරමුදලින් පළාත් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

පළාත් පාරිසරික අධිකාරියේ මුදල් වර්ෂය හා විගණනය.

06. 1. පළාත් අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

2. පළාත් අධිකාරිය විසින් අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා වගකීම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

3. විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම පළාත් අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

4. පළාත් අධිකාරියේ ගිණුම් විගණනය කිරීමෙන් අනතුරුව විගණකාධිපති හෝ ඔහු වෙනුවෙන් උතුරු මැද පළාතට අදාළ රාජ්‍ය නිලධාරියා විසින් උතුරු මැද පළාත් සභාව වෙත සෑම ලිත් වර්ෂයක් අවසානයේ දී නිරීක්ෂණ වාර්තාවක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පළාත් පාරිසරික උපදේශක සභාව.

07. 1. "උපදේශක සභාව" වශයෙන් හඳුන්වනු ලබන්නාවූ පළාත් පාරිසරික උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එය විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) පළාත් සභාවේ ඒ ඒ පළාත් අමාත්‍යාංශවල ලේකම් හෝ එම පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ වෙනත් යම් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු බැගින්,

(ආ) උතුරු මැද පළාත් සභා ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම්වරුන් ;

(ඇ) පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ;

(ඈ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ;

(ඉ) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ;

(ඊ) කෘෂිකර්ම හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ;

(උ) වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ;

(ඌ) මහාමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

(එ.) පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ උතුරු මැද පළාතේ දිස්ත්‍රික් භාර නිලධාරින් හෝ ඔවුන් විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිළධාරින් දෙදෙනෙකු

(ඒ.) දේශීය වෛද්‍ය අමාත්‍යාංශය භාර ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ඔ.) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ඕ.) උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ක.) ශ්‍රී ලංකා මහවැලි ව්‍යාපාරය භාර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ග.) ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පළාත් කලමණාකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ච.) නාගරික සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ජ.) ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ උතුරු මැද පළාත් නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ට.) ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ උතුරු මැද පළාත් නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි හෝ ඔහු විසින් විශේෂයෙන් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

(ඩ.) භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ උතුරු මැද පළාතේ දිස්ත්‍රික් භාර නිලධාරින් හෝ ඔවුන් විසින් විශේෂයෙන් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරින් දෙදෙනෙකු.

(ත.) රජයේ හෝ පළාත් සභාවේ හෝ වෙනත් ආයතනයක හෝ ප්‍රධානීන් (අදාල නිලධාරියාගේ විශේෂඥ දැනුම අවශ්‍යයැයි විෂයභාර අමාත්‍යවරයා අදහස් කරන විශේෂ අවස්ථාවකදී )

(ද.) රජයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරින් පත් කිරීමේදී අදාළ අමාත්‍යාංශයේ එකඟතාව මත එය කළ යුතු ය.

පළාත් අධිකාරියේ වගකීම්, බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳව පළාත් අධිකාරියට සාමාන්‍ය උපදෙස් දීම සහ පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවට හෝ උපදේශක සභාවේ අදාල විෂය පිළිබඳ විශේඥ භාවය ඇති අයෙකුට හෝ අනුකමිටුවකට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව විමර්ශනය කර පළාත් අධිකාරියට වාර්තා කිරීම උපදේශකයන්ගේ කාර්‍ය විය යුතු ය. (ඒ පිළිබඳ ලබාදෙන නිර්දේශ හා උපදේශ සම්බන්ධයෙන් තීරණ ගැනීම පාරිසරික අධිකාරිය සතුය.) උපදෙස් ලබා දීම

2. පළාත් අධිකාරියේ උපදේශක සභාවේ සාමාජිකයින්ට මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමික හෝ දීමනා හෝ පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

8.1. යම් තැනැත්තෙක් - පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ සාමාජිකත්වයට නුසුදුසුකම්

(අ.) පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවේ හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ සභිකයෙකු වුවහොත්, හෝ

(ආ.) විෂයභාර අමාත්‍යවරයා විසින් අස් කරනු ලැබුවහොත් හෝ ස්ථාන මාරුවක් හෝ වෙනයම් හේතුවක් නිසා, හෝ

(ඇ) සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලබනු ලැබීමට හේතුකාරක වූ තමාට අදල නිල රාජකාරිය, ස්ථාන මාරුවක් හෝ වෙනයම් හේතුවක් නිසා වෙනස් වුවහොත් ඔහු පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ

සාමාජිකයෙකු ලෙස සිටීම සඳහා හෝ නුසුදුස්සකු වන්නේ ය.

(ඉ.) 3.1 වන වගන්තිය යටතේ පළාත් අධිකාරියට හෝ 7.1 වගන්තිය යටතේ උපදේශක සභාවට පත් කරන ලද යම් සාමාජිකයෙකුට සාමාජික කාලය 8.1 වගන්ති යටතේ නුසුදුස්සකු නොවුවහොත් පත්කළ දින සිට වර්ෂ 3 ක කාලයකට වලංගු විය යුතු ය.

(ඊ.) යම් සාමාජිකයෙකු පත්කිරීමෙන් අනතුරුව වර්ෂ තුනක් ඉකුත්වීමට පෙරාතුව 8.1 වගන්තියෙන් නුසුදුස්සකු වුවහොත් ඔහු වර්ෂ 3 සපිරීම තෙක් වූ කාලය සම්පූර්ණ වනතෙක් පමණක් බලපැවැත්වෙන පරිදි ඔහු වෙනුවෙන් අදල පරිදි වගන්තියෙන් 3.1 හෝ 7.1 වගන්තියේ සඳහන් අය අතුරින් වෙනත් අයෙකු අදළ පරිදි විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

සාමාජිකයෙකුගේ නිල කාලය අවසන්වීම කාර්යයන්ට බාධාවක් නොවන බව

2. යම් සාමාජිකයෙකු හෝ සාමාජික පිරිසක් හෝ නිල කාලය අවසන් වූ පමණින් යම් සාමාජිකයෙකු පත් කිරිමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ කාර්යයන්ට බාධාවක් හෝ බල රහිත වීමක් සිදුනොවිය යුතු අතර, එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.

ලේකම්ගේ නිලයෙහි වැඩ ආවරණය කිරීම.

3 දිවයිනෙන් බැහැර වීම හෝ රෝගාතුර වීම හෝ වෙනයම් හේතුවක් මත පළාත් අධිකාරියේ ලේකම්වරයාට එම ධුරයහි සේවය කිරීමට නොහැකි වන අවස්ථාවක අදළ විෂයභාර අමාත්‍යවරයා විසින් තාවකාලිකව එම ධුරයට අදල නිල තනතුරෙහි වැඩ බලන නිලධාරියා පත්කළ හැකිය.

සාමාජකයෙකු ඉල්ලා අස්වීම

4 තමා පත්කිරීමට අදළ වූ යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ උපදේශක සභාවේ යම් සාමාජිකයෙකුට අදළ පරිදි විෂයභාර අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම්දීමක් කර ඉල්ලා අස්විය හැකිය.

09. පළාත් අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී විෂයභාර අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස් හා නියෝග වලට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

ප්‍රාදේශීය පරිසර කමිටු

10. 1. උතුරුමැද පළාතේ සියලු පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය පරිසර කමිටු ක්‍රියාත්මක විය යුතු ය.

11. මෙම පරිසර කමිටුවට දැනට පැවරී ඇති බලතල වලට අමතරව පළාත් පරිසර අධිකාරිය විසින් පවරන ලද අතිරේක බලතල රාජකාරි හා වෙනත් උපදෙස් ක්‍රියාත්මක කළ යුතු ය.

## II වන පරිච්ඡේදය

පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන්

11. පළාත් අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී විෂයභාර අමාත්‍යවරයා ගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයේ ලේකම් විසින් කලින් කල නිකුත් කරනු ලබන විධි විධානවලට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

(අ.) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම.

(ආ.) පළාත් සීමා තුළ පාරිසරික සංරක්ෂණය සඳහා අවශ්‍ය පස සංරක්ෂණය, වන සංරෂණය, වායු, ජල, ගොඩබිම දූෂණය වලක්වා ලීම සඳහා අවශ්‍ය ක්‍රම සම්පාදනය, වායු,ජල, ගොඩබිම, පරිහරණය කිරීමේදී සංරක්ෂණය කර ආරක්ෂා කළ යුතු වායු, ජල, ගොඩබිම් සීමාවන් වෙන්කර සැලසුම් සම්පාදනය යන කරුණු පිළිබදව අවශ්‍ය වන්නා වූ සංශෝධන හෝ රීති සැකසීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් අනුව අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන හෝ රීති සකස්කර ඉදිරිපත් කිරීම.

(ඇ.) පරිසරය දූෂණය ඇති වීමේ හේතූන් හා එහි ස්වභාවය, ප්‍රමාණය හා එය වැළැක්වීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් සමීක්ෂන හා විමර්ශන පැවැත්වීම හෝ ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ එකගතාවය ඇතිව සමීක්ෂන හෝ විමර්ශන මණ්ඩල පත් කිරීම සහ පළාත් අධිකාරීයේ කර්තව්‍යයක් ඉටුකිරීමෙහිලා සහය වීය හැකි විශේෂ කමිටු පත් කිරීම.

(ඈ.) පරිසරය වඩා වැඩ දයි ලෙස උපයෝගී කර ගැනීම සහ ආරක්ෂා කර ගැනීම සඳහා ද එම තත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායයන් උපමානයන් සහ නියමයන් නිශ්චය කිරීම හා නියම කිරීම.

(ඉ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අදළ පොත් පත්, ලිපි ලේඛන වාර්තා, තොරතුරු හා දැන්වීම් ආදිය ප්‍රකාශයට පත් කිරීම.

(ඊ) මෙම උතුරු මැද පළාත් පාරිසරික ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම සඳහා විමර්ශන, පරීක්ෂණ පැවැත්වීම හා එම විධිවිධාන උල්ලංඝණය කර ඇති බවට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉහත කී (ඊ) අතුරු වගන්තිය යටතේ විමර්ශන පරීක්ෂණ පැවැත්වීම සඳහා යොදගත යුතු ක්‍රම, විධිවිධාන තීරණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පුද්ගලයන්, නිලධාරීන් හෝ පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් අයෙකු යෙදවීම.

(ඌ) පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම, සම්බන්ධයෙන් මහජනයාට තොරතුරු හා අධ්‍යාපනය ලබා දීම.

(එ) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් වෙනත් දේශීය හෝ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධතා ඇති කිරීම පවත්වාගෙන යාම සහ අධ්‍යාපනික හුවමාරු වැඩ සටහන් ඇති කර ගැනීම.

(ඒ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන හෝ සැලසුම් සකස් කිරීම සහ පරිසරය සංරක්ෂණය සඳහා මහජනයා හෝ ආයතන දිරිගැන්වීම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඔ) පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීම වැළැක්වීමට ද පරිසරයේ තත්වය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීමට ද අදල සියලු කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඕ) උතුරු මැද පළාත් සීමාව තුළ යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස එම පළාත් පාලන ආයතනයට නියම කිරීම සහ පහත සඳහන් අංශ සියල්ල හෝ යම් අංශයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම :–

(i). කුණුකසල, මලමූත්‍ර, හෝ වෙනත් අපද්‍රව්‍ය අනවසරයෙන් බැහැර කිරීම, පිට කිරීම හෝ තැන්පත් කිරීම තහනම් කිරීම සහ එම කාර්ය කළමනාකරණය නියමයක් පැනවීම;

(ii). පස, වාතය, ඇළ මාර්ග හෝ ජල මාර්ග කරා පවිත්‍ර, නොකළ මල මූත්‍රා, කැලි කසල වෙනත් අපද්‍රව්‍ය හෝ කාර්මික හෝ කෘෂිකාර්මික කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ කාබනික ධූමය හෝ පරිසරයට හා මහජන සෞඛ්‍යයට අහිතකර වූ අපද්‍රව්‍ය අංශු සහිත වායු හෝ ධූමය හෝ බැහැර කිරීම හෝ පිට වීම ඉඩසැලසීම වැළැක්වීම සහ තහනම් කිරීම සහ එම කාර්යය කළමනාකරණ නියමයන් පැනවීම ;

(iii). බිත්තිවල හෝ ගොඩනැගිලිවල හෝ වෙනත් යම් අවසර නොලත් ස්ථානවල හෝ මහා මාර්ගයේ හෝ දැන්වීම්, පත්‍රිකා ප්‍රදර්ශනය කිරීම, තහනම් කිරීම සහ ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදි කිරීමේ කාර්ය විධිමත් කිරීම ;

(iv). දර්ශනීය ස්ථාන, රජයේ දේපල, ඓතිහාසික නටඹුන් විරූප කිරීම වැළැක්වීම ;

(v). වායු, ශබ්ද හා භෞමික දූෂණය පාලනය කිරීම හා එම කාර්ය කළමනාකරණය සඳහා නියමයන් පැනවීම ;

(vi). සෞඛ්‍යයට හා පරිසරයට අපද්‍රව්‍යකාරී යම් ද්‍රව්‍යයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම තහනම් කිරීම හෝ ඒ සඳහා අවශ්‍ය නියමයන් කිරීම හා ;

(vii). මාර්ග දෙපස හෝ උද්‍යානවල හෝ රුක් ගොමුවල හෝ වෙනත් පොදු ස්ථානවල හෝ රෝපණය කළ හෝ රෝපණය වී ඇති පැළ සහ වෘක්ෂවලට හානි කිරීම වැළැක්වීම සහ එම පැළ සහ වෘක්ෂ ආරක්ෂා කිරීම සහ අලංකාර කිරීම පවත්වාගෙන යාම සඳහා විධිවිධාන යෙදීම සහ ආරක්ෂා කිරීම සඳහා දිරිගැන්වීම වශයෙන් ඉදිරිපත් කළ නිර්දේශ හෝ යෝජනා ක්‍රියාත්මක කිරීම හා එම කළමනාකරණ නියමයන් පැනවීම;

පළාත් පාලන ආයතනවලට විධාන දීමට ඇති බලය.

(viii) පළාත් අධිකාරිය විසින් යම් පළාත් පාලන ආයතනයක සීමා ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම , රැක ගැනීම සහ වැඩි දියුණු කිරීම අවශ්‍ය යැයි පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම්කිසි ක්‍රියාවක් හෝ දෙයක් කරන ලෙසට හෝ කරනු ලැබීමට සලස්වන ලෙසට විශේෂ හෝ පොදු උපදෙස් ලිඛිතව නිකුත් කළ හැකිය.

(ix) එබඳු යම් උපදේශයක් දෙනු ලැබූ විට අදළ පළාත් පාලන ආයතනය විසින් එම විධිවිධානය අනුව ක්‍රියාකළ යුතුය.

## III වැනි පරිච්ඡේදය

### (පළාත් පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය)

සාමාන්‍යාධිකාරි වරයා

12. 1. (අ) පළාත් අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කළ යුතුය. පාරිසරික කළමණාකරනය /උද්භිද විද්‍යාව,සත්ව විද්‍යාව ජීව විද්‍යාව/කෘෂි විද්‍යාව/භූගෝල විද්‍යාව, පිළිබඳ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ වෘත්තීය සුදුසුකම් ලබා ඇති තැනැත්තන් අතරින් මොහු පත්කරනු ඇත (ඉහත සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන්ගෙන් ද්විතීයනය හෝ අනුයුක්ත කිරීමේ පදනම මත මෙම පත්වීම සිදුකළ හැකිය)

පළාත් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා

2. (අ) පළාත් අධිකාරියේ ප්‍රධාන විධායකයා සභාපතිවරයා වන අතර අධිකාරියේ කටයුතු මෙහෙයවීම, සංවිධානය හා ක්‍රියාත්මක කිරීම ද අධිකාරියේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලන හා පාලනය ද, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව සාමාන්‍යාධිකාරීවරයා වෙත භාරවිය යුතුය.

සාමාන්‍යාධිකාරි- වරයාගේ දීමනා

(ආ) ඒ සඳහා පළාත් අධිකාරිය විසින් 13(2) වගන්තිය යටතේ නියම කරනු ලබන සුදුසු පාරිශ්‍රමිකයන් ඔහුට ගෙවනු ලැබිය යුතුය.

(ඇ) පළාත් අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා ලේකම්වරයා වශයෙන් කටයුතු කරනු ඇත. ඔහුට පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපදේශක සභාවේ රැස්වීම්වලට සහභාගී වීමේ හිමිකම ඇති නමුත් එහි රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකමක් නොවිය යුතුය.

සාමාන්‍යාධිකාරි- වරයාට/ ලේකම් වරයාට රැස්වීමකදී ඡන්දය දීමට නොහැකි බව

(ඈ) පළාත් අධිකාරියේ සහ උපදේශක සභාවේ ලේකම්වරයාගේ ධුර කාලය ඔහු සිය නිල තනතුර දරන තාක් කල් බලපැවැත්වෙනු ඇත.

සෙසු කාර්ය මණ්ඩලය

13. 1. කාර්යක්ෂම ලෙස පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි පළාත් අධිකාරිය තීරණය කරනු ලබන අධිකාරියේ කටයුතු සම්බන්ධිකරණය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරක, ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් සහ පරිසර කටයුතුවලට අදළ විශේෂ දැනුමක් ඇති උපදේශකවරුන් හා සෙසු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය නිලධාරීන්, සේවකයන් අධිකාරිය විසින් නියම කරනු ලබන බඳවා ගැනීමේ කාර්ය පටිපාටියට අනුකූල ව පත් කරනු ලැබිය හැකිය.

2. පළාත් අධිකාරිය විසින් නියම කරනු ලබන නියෝග මගින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ එසේ ම නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව තීරණය කරනු ලබන පරිශ්‍රමිකයන් හෝ දීමනාවන් එකී කාර්ය මණ්ඩලයට ගෙවනු ලැබිය හැකිය.

3. පළාත් අධිකාරියේ ඉල්ලීම පිට රජයේ, පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු හෝ සේවකයකු එම සේවකයාට අදාළ බලධාරියාගේ අනුමැතිය හෝ මුදා හැරීම මත පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව හෝ දිවිතීයනය පදනම මත හෝ අනුයුක්ත පදනම මත හෝ නැතහොත් ස්ථිර කාර්ය මණ්ඩලයට පත්කරනු ලැබිය හැකිය.

4. පළාත් අධිකාරියේ නිළධාරීන් හා සේවකයන් බඳවා ගැනීමේ දී පළාත් අධිකාරිය විසින් නියම කරනු ලබන නියෝග මගින් කරනු ලබන සුදුසුකම් හා සේවා කොන්දේසි පළාත් අධිකාරියේ සභාපති හා ලේකම් හැර සියලු නිළධාරීන් හා සේවකයින්ට අදළ විය යුතු ය.

IV වන පරිච්ඡේදය

**පාරිසරික කළමනාකරණය**

14. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා පළාත් සභා සීමාව තුළ ඉඩම් මනාව උපයෝගී කර ගැනීමේ ක්‍රමයක් මෙකී දැක්වෙන පරමාර්ථවලට ගැලපෙන පරිදි සකස් කිරීම පහත විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම කළ යුතු ය. ඉඩම් කළමනාකරණය

(අ) ඉඩම්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීම පිණිස ඉඩම් සහ ඒවායේ සම්පත් පරිහණය සඳහා ක්‍රමානුකූල හා කාර්යක්ෂම සැළැස්මක් සකස් කිරීම ;

(ආ) මුඩු ඉඩම්, වගා නොකළ ඉඩම් අතහැර දමා හෝ නොසලකා හැර ඇති ඉඩම් වඩා ප්‍රයෝජනවත් ලෙස වගා නොකළ භාවිතා කිරීම හෝ පරිහනය කිරීම සඳහා කොන්දේසි හෝ නියෝග පැනවීම;

(ඇ) පළාතේ අවශ්‍යතාවයන් සහ ඉඩම් සම්පත් අතර අසමබරතාවයක් ඇතිවීම වැළැක්වීම පිණිස ඒ සම්පත් වඩා ක්‍රමවත් ලෙස උපයෝගී කර ගැනීම සහ සංරක්ෂණය කිරීම ;

(ඈ) එම ඉඩම්වල, ගම්මාන හෝ ප්‍රදේශවල වගා කළ යුතු භවභෝග නියම කිරීම ;

15. දහහතරවන වගන්තිය යටතේ සම්පාදිත ඉඩම් කළමනාකරණය කර ගැනීමේ ක්‍රමයට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය. ඉඩම් කළමනාකරණය කර ගැනීමේ ක්‍රමය.

(අ) විද්‍යානුකූල ඉඩම් වර්ගීකරණ ක්‍රම සහ ඉඩම් වර්ගීකරණ ලැයිස්තුවක් ;

(ආ) වර්තමාන ඉඩම් උපයෝගී කර ගැනීම, එම ඉඩම් ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රමාණය, ඌන ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය, නිෂ්ක්‍රිය නැතහොත් අතහැර දමා ඇති ප්‍රමාණය ;

(ඇ) ප්‍රජා සංවර්ධනයට, කෘෂිකර්මයට, කාර්මික කටයුතුවලට, වානිජ කටයුතුවලට සහ පදිංචියට ඉඩම් යොදගැනීමේ හැකියාව පිළිබඳ නිවැරදිව හා සවිස්තරව තීරණය කිරීම ;

(ඈ) පාලනයෙන් තොරව සංවර්ධන කටයුතුවලට හා වෙනත් කාර්යයන් සඳහා යොද ගැනීමේදී හානි සිදුවිය හැකි වැදගත් ඓතිහාසික, සංස්කෘතික, සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති හෝ එම ඉඩම් සංවර්ධනය කිරීමෙන් පරිසර සංරක්ෂණයට හානි පැමිණිවිය හැකි ඉඩම් හා ප්‍රදේශ හඳුනා ගැනීම ;

(ඉ) පාරිසරික පාලනය අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි ප්‍රදේශවල ඉඩම් උපයෝගී කර ගැනීම පළාත් සභාව විසින් පාලනය කරනු ලැබීම සඳහා ක්‍රමයක් ;

(ඊ) පුද්ගලයන් පදිංචි කිරීම සහ ගම් පුළුල් කිරීම සඳහා අළුත් ප්‍රදේශ තෝරා ගැනීමට සහ ඒ ප්‍රදේශ තුළ හා ඒ අවට ඉඩම් උපයෝගී කර ගැනීම පිළිබඳව උචිත පාලන විධි තහවුරු කිරීම සඳහා වූ ක්‍රම කෙරෙහි බලපාන ප්‍රතිපත්තියක්.

**ස්වාභාවික සම්පත්**

16. පළාතේ ස්වාභාවික සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස සහ ඒවා අනාගත පරම්පරාවට ආරක්ෂා කර තැබීම පිණිස එම ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා මූලික ප්‍රතිපත්තියක් සහ ඒ ප්‍රතිපත්ති ඵලදයි ලෙස ක්‍රියාවට නැගීම පිණිස වූ පොදු ක්‍රියාමාර්ග පිළිබඳව ද පළාත් අධිකාරීය විසින් උපදේශක සභාවේ අදහස් විමසා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාද ඉදිරිපත් කළ යුතු ය. ස්වාභාවික සම්පත් (වැලි, ගල්, බොරළු, පස් ඇතුළු වෙනත් භෞමික ද්‍රව්‍ය) පරිහරණයේදී ඒ වෙනුවෙන් පළාත් පරිසර අධිකාරියට ගාස්තුවක් අයකරගැනීම මෙමගින් සිදුවිය යුතු ය. ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ සංරක්ෂනය

### ධීවර සහ ජලජ සම්පත්

ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති

17. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා උතුරු මැද පළාත් සහා සීමාවට ඇතුළත් අභ්‍යන්තර ජලයෙහි ධීවර සහ ජලජ සම්පත් විධිමත්ව හා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාද ඉදිරිපත් කළ යුතු ය.

### වන සත්ත්ව සම්පත්

වන සත්ත්ව සම්පත් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්තිය

18. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා උතුරු මැද පළාතේ වන සත්ත්ව සම්පත් ක්‍රමවත්ව ප්‍රයෝජනයට ගැනීමේ සහ සංරක්ෂණය කිරීමේ ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතු ය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාද ඉදිරිපත් කළ යුතු ය.

### *වන සම්පත්*

19. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා සකස් කරනු ලබන,

1. වන සම්පත් විධිමත්ව ප්‍රයෝජනයට ගැනීම.
2. වඳවී යාමට භාජනය වී ඇති හෝ ආරක්ෂාව කළ යුතු වූ වන සම්පත් ආරක්ෂා කිරීමේ, සංවර්ධන කිරීමේ නැවත වගා කිරීමේ සහ එම සම්පත් විනාශ කිරීම, අළෙවි කිරීම සීමා කිරීමේ සහ තහනම් කිරීම;
3. වන සංරක්ෂණය හා රුක් රෝපණය සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීමේ සහ දිරිමත් කිරීම;
4. ඉඩම් වර්ගීකරණය කිරීම, වන ව්‍යාපෘතිය කළමනාකරණය කිරීම, කාර්මික වටිනාකමකින් යුක්ත සහ ඉන්ධන දව වටිනාකමකින් යුක්ත වෘක්ෂ රෝපණය කිරීම, උද්‍යාන හා වන සත්ත්ව කළමනාකරණය කිරීම, වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, සංවර්ධන කාර්යයන්හිදී වන හානි සීමා කිරීම හා අවම හානියක් සඳහා අවශ්‍ය විධිවිධාන සැළසීම, මාර්ග දෙපස රුක් රෝපණය කිරීම සහ රුක් රෝපණ කටයුතු විධිමත් කිරීම වනෝද්‍යාන, රුක් ගොමු, වන ආශ්‍රිත විවේක ස්ථාන පිහිටුවීම, පස වර්ධනය හා සංරක්ෂණය කිරීම. ආදී කාර්යයන් ඉටුකිරීම සඳහා ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. එම නිර්දේශ විෂය භාර අමාත්‍යවරයා විසින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව දෙනු ලබන උපදෙස් මත නියෝග සකස් කළ යුතු ය.

### *පස සංරක්ෂණය*

පස සංරක්ෂණ කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්තිය.

20. වාරිමාර්ග කෘෂිකර්ම හා ඉඩම්, මහාමාර්ග සහ පළාත් පාලන විෂයභාර පළාත් අමාත්‍යංශයවල සහාය ඇතිව පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා අවදානම් සහිත ජල බස්නා ප්‍රදේශ හඳුනාගැනීම, ආරක්ෂා කිරීම, පාංශු ඛාදනය සීමා කෙරෙන හා විද්‍යාත්මක ගොවිතැන් විධි හඳුනාගැනීම, අධ්‍යයන කිරීම සහ හඳුන්වා දීම, පාංශු ඛාදනයට ලක්වන භූමි ප්‍රදේශ හඳුනාගැනීම, සංරක්ෂණය කිරීම, පාංශු ඛාදනයට හේතුවන වගාවන් හෝ වෙනත් ක්‍රියාවන් සීමා කිරීම, තහනම් කිරීම සහ දිරිගැන්වීම සහ පාංශු ඛාදනයෙන් වන හානී හඳුන්වා දීම, මහාමාර්ගවල හා ඉඩම්වල ජල බස්නා ක්‍රම විධිමත් කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳ වැඩ සටහනක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි නියෝග සාද ඉදිරිපත් කළ යුතුය.

## *V වන පරිච්ඡේදය*

### පාරිසරික ආරක්ෂාව

21.1. මෙහි අදාළ දිනය වශයෙන් සඳහන් කරනු ලබන විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි කවර හෝ තැනැත්තෙකු විසින්,

(අ.) පළාත් අධිකාරීය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ

(ආ.) මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට, උපමානවලට, කොන්දේසි සහ නියෝගවලට අනුකූලව හැර, පරිසරය දූෂණය විය හැකි අපද්‍රව්‍ය, එනම් කුණුකසල, සත්ත්ව හෝ ශාක කොටස් මළමුත්‍රා, කාර්මික හෝ කෘෂිකාර්මික විෂ රසයාන ද්‍රව්‍ය, කාබනික ද්‍රව්‍ය හෝ පරිසරයට සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාවට අහිතකර වූ අපද්‍රව්‍ය අංශු සහිත හෝ අප්‍රසන්න ගන්ධනයකින් යුතු වායු හෝ ධූමය බැහැර කිරීම, පිට කිරීම හෝ බැහැර වීමට, පිටවීමට ඉඩ සැලසීම නොකළ යුතුය.

අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම.

22. 1. පළාත් අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක ඒ සඳහා පළාත් අධිකාරිය වෙත කරනු ලබන යම් ඉල්ලීමක් මත පළාත් අධිකාරීය වෙත නියමිත ගාස්තුව ගෙවීම මත මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හා උපමාන වලට, කොන්දේසි හා නියෝග වලට අනුකූලව 20 වැනි වගන්තියේ ප්‍රකාශිත අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, වායු හෝ දූමයන් පරිසරය වෙත බැහැර කිරීමට හෝ පිට කිරීමට පරිසරයේ තැන්පත් කිරීමට ප්‍රඥප්තියේ iv වැනි කොටසේ දැක්වෙන කාරණා වලට අදාළ සකස්කරන ලද නියෝග යටතේ කටයුතු කිරීමට යම් ආයතනයකට හෝ තැනැත්තෙකුට බලය පවරමින් තාවකාලික හෝ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

බලපත්‍ර නිකුත් කිරීම.

2. එසේ වුවද එම බලපත්‍රය වලංගු කාලය නිශ්චිතව එහි සඳහන් විය යුතු අතර, එකවර ලිත් වර්ෂයක් ඉක්මවා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය. එසේ වුවද ඇතිවන හදිසි හා අනපේක්ෂිත තත්වයන් යටතේ බලපත්‍ර කාලසීමාව පිළිබඳව සමාලෝචනය කළ හැකිය.

බලපත්‍ර වලංගු කාලය.

3. 22-1 උප වගන්තිය අනුව යම් කාර්යයක් සඳහා යම් බලපත්‍රයක් නිකුත් කළ පසු එම කාර්යය බලපත්‍රයේ කාලසීමාව ඉක්මවා තවදුරටත් පවත්වාගෙන යාහැකි වන්නේ අළුතින් බලපත්‍රයක් ලබා ගැනීම හෝ අළුත්කර ගැනීමෙන් පසුව පමණක් විය යුතුය.

2. එසේ වුවද භෞමික සම්පත් (අභ්‍යන්තර හා මතුපිට) පරිහරණයේ දී හෝ ඉවත්කර ගැනීමේදී ඉවත්කර ගන්නා ප්‍රමාණයන් අනුව පළාත් පරිසර අධිකාරියට ගාස්තුවක් ගෙවිය යුතුය. එසේ වුවද මතුවන හදිසි හා අනපේක්ෂිත තත්වයන් යටතේ මෙම බලපත්‍ර පිළිබඳ සමාලෝචනය කළහැක.

23. (අ.) 22 වගන්තියට අනුකූලව බලපත්‍රයක් නිකුත් කිරීමේ දී අදළ කාරණය සම්බන්ධයෙන් යම් පළාත් අමාත්‍යංශයකින්, දෙපාර්තමේන්තුවකින් හෝ ආයතනයකින් හෝ යම් නිලධාරියෙකුගෙන් වාර්තාවක් හෝ නිර්දේශ ලබා ගත යුතු යැයි පළාත් අධිකාරිය අදහස් කරනු ලබන්නේ නම් එම ඉල්ලීම පිළිබඳව වාර්තාවක් හෝ නිර්දේශයක් සපයන ලෙසට යම් පළාත් අමාත්‍යංශයකට, දෙපාර්තමේන්තුවකට හෝ ආයතනයකට හෝ යම් නිලධාරියෙකුට යොමු කරනු ලැබිය හැකිය.

(ආ.) එසේ යොමු කරනු ලැබූ කාරණය සම්බන්ධයෙන් අප්‍රමාදව අදළ පළාත් අමාත්‍යංශය, දෙපාර්තමේන්තුව හෝ ආයතනය විසින් වාර්තාව හෝ නිර්දේශය පළාත් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ.) එම වාර්තාව හෝ නිර්දේශය ලැබෙන තෙක් පළාත් අධිකාරිය විසින් අදළ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් නොගත යුතුය.

බලපත්‍රයක් සම්බන්ධව අදළ අමාත්‍යංශයකින් දෙපාර්තමේන්තුවකින් හෝ ආයතනයකින් වාර්තා ලබා ගැනීම.

24. (අ.) අංක 22 වගන්තිය යටතේ යම් බලපත්‍රයක් ලැබූ අයෙකු පළාත් අධිකාරිය විසින් නියම කරන ලද කොන්දේසි හෝ නියමයන් හෝ බලපත්‍රයෙහි සඳහන් විධිවිධාන කිසිවක් උල්ලංඝණය කර හෝ, නොසළකා හැර ඇති අවස්ථාවක හෝ අපද්‍රව්‍ය පිටකරනු ලැබීමට, තැන්පත් කරනු ලැබීමට, තවදුරටත් නුසුදුසු යැයි හෝ නිශ්ඵල යැයි පළාත් අධිකාරිය විසින් තීරණය කරන ලද අවස්ථාවක එකී බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකිය.

(ආ.) එසේ අත්හිටවූ හෝ අවලංගු කළ වහාම ඊට අදළ ක්‍රියාව නතර කළ යුතුය.

බලපත්‍ර අත්හිටු වීම හෝ අවලංගු කිරීම.

25. 1. (අ.) පළාත් අධිකාරිය විසින් 22 වගන්තිය යටතේ බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කළහොත් ඒ බව අදළ අයට දැනුම් දිය යුතුය.

(ආ.) එසේ දැනුම් දීමෙන් අතෘප්තියට පත් අයෙකුට එකී දැනුම් දීමේ දිනයේ සිට දින පහක් ඇතුළත විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවන ලිපියක් මගින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

බලපත්‍රයක් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කළ විට අභියාචනා ඉදිරිපත් කිරීම.

(ඇ.) එබඳු අභියාචනයක් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයාගේ ලේකම් විසින් උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් මගින් පරීක්ෂණයක් පවත්වා ලබා ගන්නා නිර්දේශයන් මත අමාත්‍යාංශ ලේකම් තීරණය දිය යුතුය.

2. විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් ගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

## VI වැනි කොටස

### පාරිසරික තත්ත්වය

*නොසලකා හැරීම මත ස්වභාවිකව පරිසරයට අපද්‍රව්‍ය බැහැර වීම*

26. 1. (අ.) ඝන දියර හෝ වායුමය වන්නා වූ යම් අපද්‍රව්‍යක් යම් ජලාශයක් තුළට හෝ වියලිව පවත්නා විටෙක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජල මාර්ගයක පත්ලට ඇද වැටීම, අවරෝහණය වීම, බැසයාම, වාෂ්පවීම, සෝදගෙන යාම, සුළඟට ගසාගෙන යාමට, වාෂ්ප වීමට, සෝදගෙන යාමට හෝ කාන්දු වීමට ඉඩ ඇති ඉරියව්වක ස්ථාපනය කරනු ලැබුව හොත්, නැතහොත් දැනුවත්ව හෝ ස්වකීය නොසලකා හැරීම මගින් කෙලින්ම හෝ නොඑසේම, එවැනි යම් ද්‍රව්‍යක් එවැනි ඉරියව්වක ස්ථාපනය කිරීමට සැලැස්වුව හොත් හෝ එහිලා අවසර දුනහොත්,

(ආ.) වියළිව පවත්නා විටෙක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජල මාර්ගයක් පත්ලෙහි අපද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ දැනුවත්ව හෝ ස්වකීය නොසලකා හැරීම මගින්, එවැනි පත්ලක යම් අපද්‍රව්‍යයක් ස්ථාපනය කිරීමට සැලැස්වුහොත් හෝ එහිලා අවසර දුනහොත් හෝ 1 වැනි උප වගන්තියේ ව්‍යාප්තියට සීමාවන් නොවන පරිදි , ඔහු විසින් ඒ උප වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතුය.

2. 21.1 වැනි උප වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තෙකුම වරදක් කරනු අතර, වරදකරු කරනු ලැබීමේ දී

*වරදකරු වුවෙකුට දඩ නියම කිරීම.*

(අ) රුපියල් දස දහසකට නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද දවසකට හෝ ඉන් අනතුරුව එම වරද දිගටම කරනු ලබන අවස්ථාවක එම වරද එසේ දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියක දඩයකට ද ඔහු යටත් විය යුතුය.

*වායුගෝලය දූෂණය කිරීම පිළිබඳ සීමා නියම කිරීම.*

27. මේ ප්‍රඥප්තියේ 21 වැනි වගන්තියට යටත්ව අදළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට උපමානවලට අනුකූලව හැර යම් තැනැත්තෙකු විසින් වායු ගෝලය වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම හෝ ඒ තුළට පිට කිරීම හෝ නොකළ යුතුය.

*වායුගෝලය දූෂණය කිරීම.*

28. 1. කිසිම තැනැත්තෙකු විසින් වායු ගෝලය අපවිත්‍ර වීම, අහිතකර වීම, විෂ වීම, අපිරිසිදු වීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යට, සුභසාධනයට, ආරක්ෂාවට හෝ දේපල වලට හානිකර වීම, සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ශාක වලට හෝ වෙනත් සියළු ආකාරයේ ජීවීන්ට, විෂ සහිත වීම හෝ හානිකර වීම නැතහොත් ඒ වායු ගෝලය වැඩ දයි ලෙස උපයෝගී කිරීමෙහි ලා හානි කර වීම සිදු වන පරිදි හෝ එසේ සිදු වෙතැයි සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි ඒ වායු ගෝලයේ භෞතික, රසායනික හෝ ජෛව චක්‍රය වෙනස් වන ආකාරයෙන් ඒ වායු ගෝලය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම එහිලා අවසර දීම නොකළ යුතුය.

2. යම් තැනැත්තෙකු විසින්,

(අ.) මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග කිසිවක් මගින් ස්ථාපනය කිරීම තහනම් කරන ලද දියර හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් වායු ගෝලය වෙත මුද හරිනු ලැබිය හැකි යම් ආකාරයකින් ස්ථාපනය කරනු ලැබුව හොත් හෝ මේ ප්‍රඥප්තිය යටතේ ඒ සඳහා නියම කරන ලද නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුව හොත් හෝ

(ආ.) පරිසරයේ අපද්‍රව්‍ය එකතු වීම ප්‍රමාණය හෝ විශාලත්වය හේතු කොටගෙන මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට පිළිකුල් උපදවන හෝ අනිසි ලෙස පීඩාකාරී වන ගඳ බැහැරවීමට සැලැස්වුවහොත් හෝ එහිලා ඉඩ දුනහොත් හෝ

(ඇ.) නියමිත කාලය හෝ ආකාරය හෝ ස්ථානය නොවන අන්‍යාකාරයකින් අපද්‍රව්‍ය පිළිස්සුවහොත් හෝ

(ඇ.) දූෂණය වැලැක්වීමේ හෝ අඩු කිරීම සඳහාත් අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇන්ජිමකට හෝ ඉන්ධන දැමීමේ උපකරණයකට සවිකළ යුතු යැයි නියෝග වලින් නියමිත යම් යම් ක්‍රම උපායන් සවි නොකරනු ලැබූ එවැනි අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇන්ජිමක් හෝ ඉන්ධන දැවීමේ උපකරණයක් පාවිච්චි කරහොත් හෝ

29. මෙම ප්‍රඥප්තිය මගින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් මගින් හෝ ඒ යටතේ වායුගෝලය දූෂණය වීම වැලැක්වීම හෝ සීමා කිරීම සඳහා වූ යම් උපක්‍රමයක් සහිතව තනනු ලැබීමට නියම කර ඇති යම් යන්ත්‍රෝපකරණයක් වාහනයක් හෝ බෝට්ටුවක් ඒ යන්ත්‍රෝපකරණය වාහනය හෝ බෝට්ටුව එසේ තනනු නොලැබ හෝ සජ්ජිත කරනු නොලැබ සතුව සිටින, පාවිච්චි කරන, මෙහෙයවන, ඉදිකරන, විකුණන, සවි කිරීමට ඉදිරිපත් වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේය. මේ වගන්තිය යටතේ තනනු ලබන සවිකරනු ලබන හෝ සජ්ජිත කරනු ලබන සියලුම උපක්‍රම අයිතිකරුගේ වියදමින් පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

නියමිත පාලන උපකරණ සවිකොට පවත්වාගෙන යාම පැහැර හැරීම වරදක් බව

30. මේ ප්‍රඥප්තියේ විසි එක්වන වගන්තියට යටත්ව අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති වලට හා උපමාන වලට අනුකූලව බැහැර කිරීම තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය පසට බැහැර කිරීම හෝ පසෙහි තැන්පත් කිරීම හෝ නොකළ යුතුය.

පස දූෂණය කිරීම සීමා කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම

31. 1. කිසිම තැනැත්තෙකු විසින් පස හෝ පසෙහි නිෂ්පාදනය මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට හෝ සුභසාධනයට විෂවීම හෝ අපවිත්‍ර වීම හානිකර වීම හෝ හානි කර විය හැකි වීම සත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට , ශාක වලට හෝ වෙනත් සියළු ආකාරයෙන් ඒ ජීවිතයට විෂ සහිත වීම හෝ හානිකර වීම හෝ මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට අහිතකර වීම හෝ අනිසි ලෙස පීඩාකාරී වීම හෝ සිදුවන පරිදි නැතහොත් ඉඩම් එලදයි ලෙස පාවිච්චි කිරීමෙහි ලා හානිකර වන පරිදි හෝ එසේ සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි යම් පසක් හෝ ඉඩමක මතුපිට භෞතික රසායනික හෝ ජෛව තත්ත්වය වෙනස් වන ආකාරයෙන් ඒ පස හෝ ඉඩමේ මතුපිට දූෂණය කිරීම හෝ දුෂණය කිරීමට සැලැස්වීම හෝ එහිලා අවසර දීම නොකළ යුතුය.

පස දූෂණය කිරීම වරදක් බව

2. යම් තැනැත්තෙකු විසින්-

(අ) යම් පසක් හෝ යම් පසක් මත යම් පසකට ප්‍රවේග ඇතිවිය හැකි යම් ස්ථානයක මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ සාදනු ලැබූ දියර ඝන හෝ වායුමය වන්නා වූ යම් ද්‍රවයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ නියම කරනු ලැබිය හැකි නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුවහොත් සහ

(ආ) මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියට අහිතකර වන හෝ අනිසි ලෙස පීඩාකාරීවන නැතහොත් පොළව යට ඇති ජලය දූෂණය කරවන හෝ ඊට අනිෂ්ට බලපෑම් ඇති කරවන හෝ පස හෝ ඉඩම් මතුපිට එලදයි ලෙස පාවිච්චි කිරීමෙහිලා හානි කර වන පරිදි කසල ගොඩක් කුණුවලක් පස් හා ගල් බැහැර කරන බිමක් ගොහොරු මඩ තැන්පත් කරන බිමක අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හෝ ගර්බයන් වශයෙන් ඉඩම් අනවශ්‍ය ආකාරයකින් පාවිච්චි කරහොත්,

31. 1 වන උප වගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි ඔහු විසින් ඒ උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

3. නිර්දිෂ්ට පලිබෝධකයෙකු පාලනය කිරීම පිණිස නියමිත ආකාරයකින් අනුමත ඖෂධ සංයෝගයක් යෙදීම වැනි වලංගු හේතු සඳහා පූර්ව නිදහස් කිරීමේ ප්‍රදානය කරනු ලැබිය හැකිය. එසේ වුව ද එවැනි ඖෂධ සංයෝගයකින් පසට තදබල ලෙස හානි සිදු නොවිය යුතුය.

(අ.) මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග මගින් තහනම් කරන ලද ඉන්ධන කිසිවක් පාවිච්චි කරහොත් හෝ පුළුස්සනු ලැබුව හොත්, 31.1 වන උපවගන්තියේ ව්‍යාප්තියට සීමාවන් නොවන පරිදි ඔහු විසින් ඒ උප වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතුය.

මෙම විධිවිධාන කඩ කරනු ලැබූ විට දඩ නියම කිරීම

(අ) රුපියල් දස දහසකට නොඅඩුව ද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට සහ ඉන් අනතුරුව එම වරද සිදු කිරීම දිගටම කරනු ලබන අවස්ථාවක එම වරද එසේ දිගටම කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සීයක දඩයකට ඔහු යටත් විය යුතුය, තව ද

දූෂනය නිරවද්‍ය කිරීම හා අධිකාරියේ ක්‍රියාමාර්ග

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත වායු ගෝලය දූෂණය කිරීම මගින් වැඩිපුර හානි සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය යැයි සළකනු ලබන යම් නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලෙස සහ එවැනි නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලද බවට ප්‍රමාණවත් හා පිළිගත හැකි සාක්ෂි ඒ කාලය අවසානයේ දී ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම කළ යුතුය. එම වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විටත් සිදුව ඇති හානිය නිරවද්‍ය කිරීමෙහිලා අධිකාරිය විසින් කරනු ලැබිය හැකි වියදම් දරන ලෙස ද අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ ඒ තැනැත්තාට නියම කළ යුතුය.

5. 31.3 උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඔහු වරදකරු කරනු ලැබූ දින සිට සති හයක කාලයකට පසු ඒ වරද දිගටම සිදු කරගෙන යනු ලබන අවස්ථාවක තව දුරටත් හානි සිදුකිරීම වැළැක්වීමෙහිලා ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් නිරවද්‍ය කිරීමේ පියවර ගනු ලබන තෙක් වායු ගෝලයේ දූෂණය සිදු කළ ඒ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව, කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා ජ්‍යෙෂ්ඨ පරිසර විශේෂඥ / අධ්‍යක්ෂකවරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් ආඥා කළ හැකිය.

අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම

6. 31.4 වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන කවර හෝ අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් මගින් ඒ ආඥාව නිකුත් කළ දිනයේ සිට පැහැදිලි දින තුනකට හෝ දින හතකට පසුව නොවිය යුතු දිනයක් විය යුතුය. ඒ ආඥාවේ සඳහන් දිනකට පෙර ඒ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙස අධිකරණයේ පිස්කල්ට නියම කරමින් හා බලය දෙමින් ඒ පිස්කල්ට වහාම ආඥා කළ යුතුය. ඒ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා එකී පිස්කල් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් පොලිස් නිළධාරියෙකු විසින් අවශ්‍ය යැයි සළකනු ලබන යම් උපකරණ හෝ යන්ත්‍ර සූත්‍ර ද සහයකයන් ද සමග ඒ ස්ථානයට ඇතුළුවීම සඳහා ඒ පිස්කල්ට හෝ පොළිස් නිළධරයාට ඒ ආඥාව ප්‍රමාණවත් අධිකාරියක් විය යුතුය.

වරදකරු වුවහොත් දඩ නියම කිරීම

7. ඉහත වගන්ති වල විධිවිධාන අතුරෙන් කවර හෝ විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද දඩයකට සහ ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන වරදක් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් පන්සීයක දඩයකට ද ඔහු යටත් විය යුතුය.

ශබ්ද දූෂණය සීමා කිරීම.

32. මේ ප්‍රඥප්තියේ 34 වැනි වගන්තියට යටත්ව අදළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි කිසිම තැනැත්තෙකු විසින් ශබ්දක පරිමාව අධික බව හා ප්‍රමාණය සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හෝ සීමා කිරීම් ඒ තැනැත්තා විසින් පිළිපදිනු ලබන්නේ නම් මිස එවැනි අධික ශබ්දයක් පිට කිරීමට අධිකාරිය විසින් අවසර දෙනු නොලැබිය යුතුය.

ඇතැම් ශබ්ද විහිදුවීම සඳහා බලපත්‍ර දියයුතු බව

33.1 මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරිය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් දැරිය හැකි ප්‍රමාණයේ ශබ්ද සඳහා නියම කර ඇති මට්ටමේ පරිමාවට අධික බවට හෝ ප්‍රමාණයට වඩා ශබ්දයක් ඇති කිරීමට හෝ පිටකිරීමට නැතහොත් ඇති කරනු ලැබීමට හෝ පිටකරනු ලැබීමට සැලැස්වීම හෝ එහිලා අවසර දීම නොකළ යුතුය.

2. 22 හා 23 වගන්ති වල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 22.1 වන උප වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සිදු විය යුතුය.

3. මේ ප්‍රඥප්තියෙහි සදහන් කරණු වලින් පුද්ගලයෙකුට අදළව බලපත්‍ර නිකුත් කිරීමට වෙනත් යම් ලිඛිත නිතීයකින් බලය පවරනු ලැබ ඇති යම් අධිකාරියක් හෝ ආයතනයක් හෝ ප්‍රඥප්තිය යටතේ නිශ්චිත ප්‍රමිති වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

34. 1. බලපත්‍රයක් නොමැතිව හෝ යම් ප්‍රඥප්තියක් හෝ වෙනත් යම් ලිඛිත නිතීයක් යටතේ බලපත්‍රයක් යටතේ වන්නේ නම් කොන්දේසියකට සීමා කිරීමට හෝ තහනම් කිරීමට ද ඒ කොන්දේසියට සීමා කිරීමට හෝ තහනම් කිරීමට පටහැනිව අවස්ථා ගත කරුණු අනුව මධ්‍යස්ථ ප්‍රමාණයේ ශබ්දයක් වන්නා වූ ප්‍රමිතියට වඩා පරිමාවෙන් අධික බවෙන් හෝ ප්‍රමාණයෙන් අධික ශබ්දයක් ඇති කරන හෝ පිට කරන නැතහොත් ඇති කරනු ලැබීමට හෝ පිටකරනු ලැබීමට සලස්වන හෝ එහිලා අවසර දෙන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

අධික ශබ්දය වරදක් බව.

2. 34 (1) වැනි උප වගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තෙකු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද දඩයට සහ ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන වරදක් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන සෑම දිනයක් සදහාම රුපියල් පන්සීයක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

වරදකරු වුවහොත් දඩ නියම කිරීම

35 පොදු හෝ පෞද්ගලික හෝ යම් ස්ථානයක තැන්පත් කර ඇති කුණු රොඩු කිසිවක් මගින් මහජනයාගේ සෞඛ්‍යට හෝ, ආරක්ෂාවට හෝ සුභ සාධනයට හානිකර වන්නා වූ හෝ හානිකර විය හැකි වන්නා වු හෝ මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියයන්ට අනිසි ලෙස පීඩාකාරී වන්නා වූ ආකාරයට අවස්ථානුගත කරුණු එළඹ ඇති බවට අධිකාරියේ මතය වන අවස්ථාවක අධිකාරිය විසින් ලියවිල්ලකින් දැන්වීමක් මගින් ඒ කුණු රොඩු ඉවත් කරන ලෙස හෝ ඒ කුණු රොඩුවලට අදළව ඒ දැන්වීමෙහි සදහන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඒ කුණු රොඩු තැන්පත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට හෝ ඒ කුණු රොඩු බැහැර කිරීම හෝ ඉවත් කිරීම ස්වකීය කර්තව්‍ය වන යම් රජයේ අධිකාරියට හෝ විධාන කළ හැකිය.

කුණු රොඩු ඉවත් කිරීමට දැන්වීම

මේ වගන්තියේ කාර්ය සදහා කුණු රොඩු යන්නෙන් නිෂ්පාදන ක්‍රියාවලියක දී මතු වූ අතුරු නිෂ්පාදකයක් හෝ එහි වැඩදයක ක්‍රියාකාරී ජීවය අවසන් කර ඇති හා ඉවත ලා ඇති නිෂ්පාදකයින් හෝ එන්නා වූ අනවශ්‍ය අපද්‍රව්‍යයන් අදහස් වේ.

36 35 වැනි වගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමක් අනුව කුණු රොඩු ඉවත් කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ හෝ අඩු කිරීමේ ගාස්තුව අධිකාරියට ලැබිය යුතු ණයක් වශයෙන් නිසි අධිකරණය බලය ඇති යම් අධිකරණයක දී ඒ කුණු රොඩු තැන්පත් කරන ලද බවට ඔප්පු වූ යම් තැනැත්තෙකුගෙන් අයකරගනු ලැබිය හැකි අතර ඒ ගාස්තුව එසේ අයකර ගනු ලැබූ විට අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

කුණුරොඩු ඉවත් කිරීමේ ගාස්තුව ඊට වගකිව යුතු තැනැත්තාගෙන් අයකර ගත හැකි බව.

37 35 වැනි වගන්තිය යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක යොමු කරනු ලැබුවේ යම් තැනැත්තෙකුට ද ඒ තැනැත්තා සාධාරණ හේතුවක් නොමැතිව ඒ දැන්වීමේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලද බව ඔප්පු කරනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය.

දැන්වීම අනුව ක්‍රියා කිරීම, පැහැර හැරීම වරදක් බව.

38 1. *ගැසට්* පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ඒ නියමයේ සදහන් ප්‍රදේශ ඇතුළත පරිසරයේ ගුණාත්මකභාවයට අන්තරාදයක වන-

යම් ද්‍රව්‍යයක් හෝ උපකරණයක් පාවිච්චි කිරීම, තහනම් කිරීම හෝ පාවිච්චි කරන ලෙස නියම කිරීමට ඇති බලය.

(අ) යම් ද්‍රව්‍ය යම් කාර්යාවලියක් වෙළදමක් හෝ කර්මාන්තයක් සදහා පාවිච්චි කිරීම තහනම් කිරීම.

(ආ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් විස්තර කිරීම අනුව හෝ වෙළද ලකුණු අනුව පාවිච්චි කිරීම තහනම් කිරීම කළ හැකිය.

2. *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයක් මගින් අදළ අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි සඳහන් ප්‍රදේශ ඇතුළත යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් ඉදි කරන ලෙස අලුත්වැඩියා කරන ලෙස පවත්වාගෙන යන ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස නියම කරනු ලැබිය හැකිය.

3. ඉහත 1 වැනි හා 2 වැනි උප වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක වූ යම් තහනම් කිරීමක් කරන හෝ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතු ය.

සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

39 මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරද සම්බන්යෙන් වූ නඩු පැවරවීමක දී ලේකම්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක සඳහන් පරිසර දූෂණය ඒ පරිසරයට කර ඇති බවට ඒ සාක්ෂි වශයෙන් ඒ සහතිකය ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් එය මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් ද වන්නේ ය.

## VII වන පරිච්ඡේදය

### ව්‍යාපෘතියක් අනුමත කිරීම

ව්‍යාපෘතීන් අනුමත කිරීමේ අනුයෝජිත ආයතන.

40 1. මේ ප්‍රඥප්තියේ මේ කොටසේ කාර්ය සඳහා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විය යුතු මේ කොටසේ මෙහි මින්මතු පාරිසරික අනුයෝජිත ආයතන යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් පාරිසරික අනුයෝජිත ආයතනය හෝ ආයතන නම් කරනු ලැබිය යුතු ය.

2. පාරිසරික අනුයෝජිත ආයතන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රස්තුත කරුණුවලට අදාළව නියම කරනු ලබන සීමාවන්ට හා කොන්දේසිවලට හා නියෝගවලට යටත්ව ක්‍රියා කළ යුතු ය.

3. එකී පාරිසරික අනුයෝජිත ආයතන අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට ද නැවත සංස්ථාපනය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ හේතු දක්වමින් ක්‍රියා කළ හැකිය.

නියමිත ව්‍යාපෘති

41 *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයන් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ මේ කොටසේ විධිවිධාන යටතේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන්නා වූ මෙහි මින්මතු නියමිත ව්‍යාපෘති යන්නෙන් සඳහන් කරනු ලබන ව්‍යාපෘති හා ව්‍යාපාර නිශ්චිත කරනු ලැබිය යුතු ය.

නියමිත ව්‍යාපෘති අනුමත කිරීම.

42 1. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කෙසේ වුව ද මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දින සිට හා ඉන් පසුව ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සංස්ථාවක් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් පළාත් පාලන ආයතනයක් සමාගමක් ව්‍යාපාරික ආයතනයක් හෝ පුද්ගලයෙක් විසින් උතුරු මැද පළාත තුළ ආරම්භ කරනු ලබන සියලුම නියමිත ව්‍යාපෘතියක් විසින් ඒ නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ අනුමැතිය ලබා ගත යුතු ලෙස නියම කරනු ලැබේ.

2. 1 වැනි උප වගන්තියෙහි සඳහන් අනුමැතිය ඒ නියමිත ව්‍යාපෘතියට අදළ හෝ ඒ හා සම්බන්ධ ව්‍යාපෘති අනුමත කිරීමේ පාරිසරික අනුයෝජිත ආයතනයෙන් ලබාගනු ලැබිය යුතු ය.

පරිසර අනුයෝජිත ආයතනවල බල පත්‍ර අවලංගු කිරීම.

3. යම් පාරිසරික අනුයෝජිත ආයතනයක් මෙම ප්‍රඥප්තියේ හෝ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කර හෝ මෙම විධිවිධාන වලට පටහැනිව බලපත්‍රයක් නිකුත් කර ඇති බව අනාවරණය වුවහොත් හෝ එම බලපත්‍රය අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හෝ බලය පළාත් අධිකාරිය සතුවේ.

පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීම.

43 1. යම් ව්‍යාපෘතියකට අදළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් නියම කළ හැකි පරිදි වූ ද තත් කාර්යය සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කළ හැකි යම් තොරතුරු හා විස්තර ඇතුළත් වන්නාවූ ද මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් නිශ්චිත කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ස්වකීය අනුමැතිය සඳහා යම් නිශ්චිත ව්‍යාපෘතියක් ඉදිරිපත් කරන යම් පළාත් පාලන ආයතනයකින් සමාගමකින් ආයතනයකින් හෝ රාජ්‍ය හෝ ව්‍යාපාරික ආයතනයකින් හෝ පුද්ගලයෙකුගෙන් ඉල්ලා සිටීමට සෑම පාරිසරික අනුයෝජිත ආයතනයක යුතුකම විය යුතු ය.

**පාරිසරික පරීක්‍ෂණ වාර්තා ප්‍රදර්ශනය කිරීම.**

2. 1 වන වගන්තිය යටතේ පනවා ඇති නියමයට අනුකූලව ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවොචිත පරිදි මූලික පාරිසරික පරික්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් හෝ ලැබුණ විට ඒ ව්‍යාපෘතිය අනුමත කිරීමේ පළාතේ අනුයෝජිත ආයතනය විසින් *ගැසට් පත්‍රයේ* ද සිංහල දෙමළ සහ ඉංග්‍රීසී යන එක් එක් භාෂාවෙන් පළවන එක් ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලබන දැන්වීමක් මගින් එම වාර්තාව මහජනයා විසින් පරික්ෂා කරනු ලැබිය හැකි ස්ථාන හා වේලාව දැනුම් දෙනු ලැබිය යුතු අතර ඒ පිළිබද අදහස් කිසිවක් දැක්වීමට ඇත්නම් එසේ දන්වන ලෙස මහජනයාට ආරාධනා කළ යුතු ය.

3. 2 වන උප වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ දින සිට දින 30 ක් ඇතුළත මහජනයාගෙන් යම් සාමාජිකයෙකු විසින් එම දැන්වීම පළකරන ලද පාරිසරික අනුයෝජිත ආයතන වෙත ඒ පිළිබදව තමාගේ අදහස් කිසිවක් ඇත්නම් ඒ අදහස දැක්විය හැකිය.

තව ද තමන්ගේ අදහස් සනාථ කිරීම සදහා කරුණු දැක්වීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට දීම මහජන යහපත පිණිස වේ යැයි එම ආයතනය විසින් සළකණු ලබන අවස්ථාවක එම ආයතනය විසින් එම තැනැත්තාට එසේ කරුණු දැක්වීමේ අවස්ථාවක් ලබාදිය හැකි අතර එම නියමිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා ස්වකීය අනුමැතිය දිය යුතු යැයි තීරණය කිරීමෙහිලා ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් එකී කරුණු දැක්වීමේ දී හෙලි කරන ලද අදහස් සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් සැළකිල්ල දැක්විය යුතු ය.

**කාර්ය පටිපාටිය නියමිත මාර්ගෝපදේශ පදනම් කර ගත යුතුවේ.**

44. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අනුමැතිය සදහා ඉදිරිපත් කරනු ලබන නියමිත ව්‍යාපෘති කිසිවක් අනුමත කිරීමේලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඒ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් තීරණය කරනු ලැබිය යුතුය. ඒ කාර්ය පටිපාටිය අමාත්‍යවරයා විසින් තත් කාර්ය සදහා නියම කරනු ලබන මාර්ගෝපදේශ අනුව පදනම් කරගත යුතු ය.

**විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීම.**

45. 1. ස්වකීය අනුමැතිය සදහා ඉදිරිපත් කරන ලද යම් නිශ්චිත ව්‍යාපෘතියක් සදහා අනුමැතිය දීම ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඒ තීරණයට විරුද්ධව විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට අතෘප්තියට පත් තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

2. එවැනි අභියාචනයක් මත විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය විය යුතු ය. විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ තීරණය ගැනීමට පෙර උපදේශක සභාවේ නිරීක්ෂණ ද ලබාගත යුතු ය.

**යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දැමීම හෝ වෙනස් කිරීම.**

46. අනුමැතිය ප්‍රදානය කොට යම් නිශ්චිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වෙනස් කිරීම් කිසිවක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ දැනටමත් අනුමත කර ඇති යම් නිශ්චිත ව්‍යාපෘතියක් අතහැර දමනු ලබන අවස්ථාවක එවැනි අනුමැතියක් ලබාගත් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩල පළාත් පාලන ආයතන සමාගම් රාජ්‍ය හෝ වෙළද ආයතන හෝ පුද්ගලයා විසින් උචිත ව්‍යපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත අවස්ථානෝචිත පරිදි ඒ වෙනස් කිරීම හෝ අතහැර දැමීම පිළිබදව දැනුම්දිය යුතු අතර අවශ්‍ය අවස්ථාවක දැනටමත් අනුමැතිය ප්‍රදනය කොට ඇති එවැනි නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කිරීමට අදහස් කරනු ලබන වෙනස් කිරීම් කිසිවක් සම්බන්ධයෙන් නැවත අනුමැතිය ලබාගත හැකිය.

එසේ වුව ද අතහැර දමනු ලබන හෝ වෙනස් කරනු ලබන ඒ නියමිත ව්‍යාපෘතිය අධිකාරියේ එකගතාවය ඇතිව අනුමත කරන ලද ව්‍යාපෘතියක් වන අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පළාත් පාරිසරික අධිකාරියට ද දැනුම් දෙනු ලැබිය යුතු අතර ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ යම් අලුත් අනුමැතියක් අධිකාරියේ එකගත්වය ඇතිව පමණක් දෙනු ලැබිය යුතු ය.

**අනුමත නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.**

47. 1. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් අනුමැතිය ප්‍රදනය කරන ලද එක් නියමිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වාර්තාවක් පළාත් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ඒ සැම පාරිසරික අනුයෝජිත ආයතනයක ම යුතුකම විය යුතු ය.

පරිසර ආරක්‍ෂක බාධා ඉවත් කිරීම

2. (අ.) අනුමැතිය රහිත දෑ ඉවත් කිරීමේ බලය උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය ඇතුළත මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබාගෙන මිස ඉදිකිරීමට හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුතුව ඇති යම් ඉදිකිරීමක් හෝ පරිසර ආරක්ෂාවට බාධා කරන යම් බාධාවක් හෝ ප්‍රසර්පනයක් වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස ඒ ඉදිකිරීමේ ව්‍යාපාරය ව්‍යාපෘතිය බාධකය හෝ ප්‍රසර්පනය ඉදිකළ හෝ පවත්වාගෙන යන හෝ භාරව සිටින හෝ පදිංචිව සිටින හෝ සන්තකය දරන හෝ යම්තැනැත්තෙකු හෝ පාරිසරික අනුයෝජිත ආයතනයක් මගින් වාචිකව හෝ ලිඛිතව නියමයක් කිරීම නීත්‍යානුකූලව වන අතර ඒ නියමය ලැබූ තැනැත්තා විසින් පළාත් අධිකාරිය විසින් නියම කරනු ලැබූ කාලය තුළ දී ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ඒ නියමය කරනු ලැබිය යුතු පුද්ගලයා කවුරුන් ද යන වග සම්බන්ධයෙන් යම් සැකයක් ඇත්නම් පළාත් අධිකාරිය විසින් සළකනු ලබන යුක්ති සහගත කාලයක් තුළ එහි නියමය එකී ස්ථානයෙහි හෝ ඉදිකිරීමේ හෝ සවිකිරීමේ හෝ අලවා තැබීමෙන් අනතුරුව පළාත් අධිකාරිය විසින්ම යම් සේවකයින් හෝ යන්ත්‍ර සූත්‍ර යොදවා හෝ වෙනයම් සුදුසු යැයි හැගෙන ආකාරයකින් එම ඉදිකිරීම හෝ බාධකය හෝ ප්‍රසර්පනය වහාම ඉවත් කරනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය.

(ආ.) එසේ නම් ඉදිකිරීමක් බාධාවක් හෝ ප්‍රසර්පනයක් ඉවත් කිරීම සඳහා පළාත් අධිකාරිය විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අවශ්‍ය විය හැකි මිනිස් ශ්‍රමය යන්ත්‍රසූත්‍ර හෝ ගව ඇත් ආදී සත්ව ශ්‍රමය ද යම් උපකරණ සමග එකී ස්ථානයට භූමියට හෝ ගෙයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළත් වීම හා එසේ ඇතුළත් වී එලෙස ඉවත් කිරීම හෝ අස්කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම නිත්‍යානුකූල වන්නේය.

වරදකරුවන් හට දඩුවම් නියම කිරීම හා වියදම් පියවා ගැනීම.

(ඇ.) එසේ ක්‍රියා කිරීමේ දී යම් බාධාවක් පමුණුවන යම් තැනැත්තෙකු වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි හෝ වර්ෂ දෙකකට නොවැඩි දෙආකාරයෙන් එක් ආකාරයේ සිර දඩුවමකට හෝ එම දඩුවම් දෙකකටම හෝ යටත් වන්නේ ය.

(ඈ.) එසේ ඉවත් කිරීමේ දී පළාත් අධිකාරිය විසින් කරනු ලැබූ සියලු වියදම් එම ඉදිකිරීම බාධකය හෝ ප්‍රසර්පනයකට අයත් ද්‍රව්‍ය උපකරණ යන්ත්‍රසූත්‍ර ගොඩනැගිලි ආදිය විකිණීමෙන් පියවා ගැනීම නිත්‍යානුකූල වන්නේය.

(ඉ.) එසේ පියවා ගත නොහැකි විට එම අලාභය දඩයක් වශයෙන් අදාළ අයගෙන් අයකර ගැනීම සඳහා උසාවි නියෝගයක් ලබාගත හැකි වන්නේය.

## *VIII* වන පරිච්ඡේදය

පළාත් අධිකාරී අතර ගැටුම් සමථ කිරීම.

48. 1. පළාත් අධිකාරිය වෙනත් පළාත් සභාවක අනුමත ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ පළාත් අධිකාරියක් අතර මෙම ප්‍රඥප්තියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ගැටළුවට සම්බන්ධ පාර්ශවයන්ගේ එකගතාවයට අනුව පහත සඳහන් ආකාරයෙන් පුද්ගලයන් තුන් (03) දෙනෙකුගෙන් සමන්විත සමථ මණ්ඩලයක් පත් කළ යුතු ය.

(අ.) ගැටළුව පවතින පළාත් අධිකාරී මගින් සමථ කරුවන් එක් අයෙකු බැගින් පත් කළ යුතු ය.

(ආ.) තුන් වන සමථකරු ඉහත (අ) උප වගන්තිය අනුව පත් කරනු ලබන සමථකරුවන්ගේ විනිශ්චය කරුවකු ලෙස කටයුතු කරනු ඇත.

2. පළමුවන උප වගන්තියට අනුව පත් කරන සමථ කරුවන්ගේ තීරණය මගින් අදාළ පළාත් අධිකාරී අතර ගැටුම් නිරාකරණය විය යුතු ය.

අපද්‍රව්‍ය පිළිබඳ පළාත් අධිකාරිය වෙත තොරතුරු සැපයීම.

49. 1. මේ ප්‍රඥප්තියේ සිද්ධාන්ත හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් පරිශ්‍රයක පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලියවිල්ලක් වූ දැන්වීමක් මගින් දින දහ හතරක් ඇතුළත හෝ දැන්වීමේ සඳහන් කර ඇති ඊට වඩා දීර්ඝ කාලයක් ඇතුළත ඒ පරිශ්‍රයේ පවත්වාගෙන යන්නා වූ යම් නිෂ්පාදනයක් කාර්මික හෝ වෙළඳ පිරිසැකසුම් පිළිබඳව හෝ එකී පරිශ්‍රයෙන් පිට කරන හෝ පිට කරනු ලැබීමට ඉඩ ඇති ඒ දැන්වීමේ සඳහන් අපද්‍රව්‍ය පිළිබඳව පළාත් අධිකාරිය වෙත තොරතුරු සපයන ලෙස එම පදිංචිකරුට නියම කළ හැකිය.

2. 1 වැනි උප වගන්තිය යටතේ කරන ලද යම් නිගමනයට අනුව අධිකාරියට සපයන ලද සියලු තොරතුරු පළාත් පාරිසරික අධිකාරිය විසින් අතිශය රහස්‍ය ලෙස සැලකිය යුතු අතර 3 වන උප වගන්තියට යටත්ව මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක කාර්යය සඳහා අධිකරණයට හැර ඒ තොරතුරු වෙනත් යම් තැනැත්තෙකුට හෙළිදරව් නොකළ යුතුය. තොරතුරුවල රහස්‍යභාවය

3. 1 වැනි උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අනුව පළාත් පාරිසරික අධිකාරියට සපයන ලද යම් තොරතුරක් හෝ කරන ලද ප්‍රකාශයක් තොරතුරු සපයන හෝ ප්‍රකාශ කරන තැනැත්තා තමා අපරාධ වර්ධනයට ලක්වීමට ඉඩ ඇති බවට ඒ තොරතුරු සපයන හෝ ප්‍රකාශය කරන අවස්ථාවේ දී විරෝධය දක්වා ඇති නම් මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් එම තැනැත්තාට විරුද්ධව යම් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් අවශ්‍ය නොවිය යුතුය.

50. 1. පළාත් අධිකාරියේ සභාපති විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකු විසින් කවර හෝ වෙලාවක යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුව- ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වී සෝදිසි කිරීමේ බලය ලේකම් වරයාට ඇති බව.

(අ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් පරීක්ෂා කිරීම හා සෝදිසි කිරීම ;

(ආ) එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කරනු ලබන බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන නැතහොත් සාමාන්‍යයෙන් පිට කරනු ලබන බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන පන්තියක හෝ වර්ගයක විය හැකි යම් දූෂණකාරකයන්ගේ සාම්පල ගැනීම ;

(ඇ) ඒ උපකරණය හෝ කාර්මික පිරියතෙන් ක්‍රියාකරිත්වයට හෝ පාවිච්චියට අදාළ වූ හෝ එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කිරීමට බැහැර කිරීමට, හෝ තැන්පත් කිරීමට අදාළ වූ යම් පොත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම ;

(ඈ) ඒ උපකරණ හෝ කාර්මික පිරියතේ ඡායාරූපයක් ගැනීම හෝ අවශ්‍ය යැයි තමා සළකන එම පරීක්ෂණය පවත්වාගෙන යාමේ දී දක්නට ලැබෙන යම් පොත්වල, වාර්තාවල හෝ ලේඛනවල පිටපත් ගැනීම ;

(ඉ) එම පරිශ්‍රය තුළ හෝ ඒ මත පවත්වාගෙන යනු ලබන එම වෙළඳාමෙහි, කර්මාන්තයෙහි හෝ කාර්යාවලියෙහි පාවිච්චි කරනු ලබන, පාවිච්චි කරනු ලැබිය හැකි හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන පාවිච්චි කරනු ලැබිය හැකි හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් ඉන්ධනයක, වස්තුවක හෝ ද්‍රව්‍යයක සාම්පල ගැනීම කළ හැකිය.

2. 1 වැනි උපවගන්තිය යටතේ එම කාර්යයන් ඉටු කිරීමේ දී යම් තදබල බාධක ඇතිවිය හැකි බවට සභාපති හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියාට හෝ සාධාරණ හේතු පෙනීයන අවස්ථාවක ඔහුට පොලිස් නිලධාරියකු සමග යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු විය හැකිය.

3. 1 වැනි උපවගන්තිය යටතේ එවැනි සෝදිසි කිරීමක්, විමර්ශනයක් කරගෙන යාමේ දී දත්ත සටහන් කිරීමේ දී හෝ සාම්පල ගැනීමේ දී පළාත් අධිකාරියේ ලේකම් හෝ බලයලත් නිලධාරියෙකු හෝ වළක්වන නැතහොත් පළාත් අධිකාරියේ සභාපති හෝ බලයලත් නිලධාරියාට බාධා පමුණුවන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය. සෝදිසි කිරීම් පරීක්‍ෂා කිරීම්වලට බාධා කිරීම වරදක් බව.

51. 1. පරිසරයට හානියක් හෝ අනර්ථයක් සිදු කරන හෝ සිදු වීමට ඉඩ ඇති යම් සංවර්ධන ව්‍යාපෘතියක හෝ යෝජනා ක්‍රමයක නිරතව සිටින හෝ නිරත වීමට ආසන්න යම් තැනැත්තෙකු වෙත ඒ හානිය හෝ අනර්ථය වැලැක්වීම හෝ නතර කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට පළාත් අධිකාරියට බලය ඇති අතර එම විධාන අනුව ක්‍රියාකිරීමේ තැනැත්තාගේ යුතුකම විය යුතුය. පළාත් අධිකාරිය විසින් විධාන නිකුත් කළ යුතු බව.

2. 1 වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ විධානය සඳහන් පියවර ඒ තැනැත්තා විසින් ගනු ලබන තෙක් මහෙස්ත්‍රාත්වරයා විසින් පළාත් අධිකාරිය විසින් කරනු ලබන ඉල්ලීම මත ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවන ලෙස ආඥකළ හැකිය. පළාත් අධිකාරියේ විධාන ක්‍රියාත්මක නොකරන විට යෝජනා ක්‍රමය අත්හිටුවීම.

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.

52. 1. *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයන් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ 11 වැනි පරිශිෂ්ටයේ විධිවිධානවලට යටත්වන ප්‍රදේශ (මෙහි මින්මතු ''ආරක්ෂිත ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාරිසරික ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කළ හැකිය.

2. ප්‍රදේශයක් ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන 1 වැනි උපවගන්තිය යටතේ වු නියමයක් මගින් ඒ ප්‍රදේශයේ යම් සළකුණු හා සීමා දැක්වීමෙන් ඒ ප්‍රදේශයේ මායිම් නියම කළ යුතුය.

ආරක්ෂක ප්‍රදේශ තුළ වෙනත් යම් නිතී අදාළ වීම.

53. 1. යම් ප්‍රදේශයක 52 (1) වගන්තිය යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් සමග ගැටෙන්නා වූ යම් නීතියක විධිවිධාන යටතේ ඒ ආරක්ෂිත ප්‍රදේශයේ වූ යම් සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් හෝ කිසියම් කර්මාන්තයක් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක වීම නතර විය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

2. 1 වැනි උපවගන්තිය යටතේ වු නියමයක් බලාත්මකව පවත්නා තාක්කල් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඒ ප්‍රදේශයේ භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් පළාත් අධිකාරිය වගකිව යුතුය.

3. 1 වැනි උපවගන්තියේ විධිවිධාන කෙසේ වුව ද *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයක් මගින් නියමයෙහි සඳහන් යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් අධිකාරිය ඒ ආරක්ෂිත ප්‍රදේශයේ සැලසුම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වගකීම් දැරීම නතර විය යුතු බව පළාත් අධිකාරියේ ඉල්ලීම පිට අදාළ අමාත්‍යවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

4. ආරක්ෂිත ප්‍රදේශයකට අදාළව 52 වගන්තිය යටතේ වූ නියෝගයක් බලාත්මකව පවත්නා තාක්කල් පළාත් අධිකාරිය නොවන කිසිම තැනැත්තෙකු විසින් ඒ ආරක්ෂිත ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනය සහ සංවර්ධනයට අදාළ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම නොකළ යුත්තේ ය.

පරිසර දූෂණ විමර්ශන නිලධාරින් පත් කිරීම

54. පළාත් අධිකාරිය විසින් -

(අ) මේ පනතේ කාර්යය සඳහා ගන්නා ලද නියැදි විශ්ලේෂනය කිරීම පිණිස රස පරීක්ෂකයන් සහ පරිසරයේ ග්‍රාහක කොටස්වලට අපද්‍රව්‍ය එකතු වී ඇති බව ඒ අපද්‍රව්‍යවල ප්‍රමාණය සහ ස්වාභාවයේ ද පරිසරයේ ග්‍රාහක කොටස් කෙරෙහි ඒ අපද්‍රව්‍යවලින් ඇති කෙරෙන බලපෑම ද සොයා ගැනීම සඳහා වූ නියමිත උපකරණ සහ සවිකිරීම සමීක්ෂණය කිරීමේ වාර්තා පරීක්ෂා කිරීම සහ ඇගයීම් සඳහා පරිසර දූෂණය පාලනය සඳහා අවශ්‍ය නිලධාරින් පත්කර ගනු ලැබිය හැකිය.

55. 1. 5 වැනි උපවගන්තියට යටත්ව පළාත් අධිකාරිය විසින් නියමයක් මගින් හෝ කර්තව්‍ය කිසිවක් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට පළාත් පාලන ආයතනයකට හෝ යම් නිළධාරියකුට පවරා දෙනු ලැබිය හැකිය.

පවරා දී ඇතිමුත් ක්‍රියාත්මක නොකල බලතල ක්‍රියාත්මක කිරීම.

2. 1 වන උප වගන්තිය යටතේ පළාත් අධිකාරිය විසින් යම් බලයක් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවකට සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට පළාත් පාලන ආයතනයකට හෝ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලබන අවස්ථාවක ඒ බලතලවලින් කිසිවක් පළාත් අධිකාරියේ ලේකම්වරයා විසින්ම ක්‍රියාත්මක කරන ලද්දේ නම් ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිව තිබුණු බලතලවලින් ලේකම්වරයා ක්‍රියාත්මක නොකළ කිසිවක් අවස්ථාවෝචිත පරිදි ඒ පළාත් සභා දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ යම් නිලධාරියෙකු විසින් හෝ ඒ නිලධාරියා විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

3. පරිසරය ආරක්ෂා කිරීමට සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ඇති පළාත් අධිකාරිය සතු යම් වගකීමකට හෝ බලයකට මේ වගන්තියේ වූ කිසිවකින් බාධාවක් නොවිය යුතුය.

4. 1 වැනි උපවගන්තිය යටතේ කරන ලද නියමයක් පළාත් අධිකාරිය විසින් කර වූ අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකිය.

5. පළාත් අධිකාරිය විසින් 1 වැනි උප වගන්තිය යටතේ

(අ) විෂයභාර අමාත්‍යවරයාගේ එකගතාවය ඇතිව හැර යම් පළාත් පාලන ආයතනයකට ; හෝ

යම් පළාත් සභා දෙපාර්තමේන්තුවක් හෝ ආයතනක් හෝ නිළධාරියෙක් සම්බන්ධයෙන් වු විටෙක ඒ පළාත් සභා දෙපාර්තමේන්තුව ආයතනය හෝ නිලධාරියා භාර පළාත් අමාත්‍යවරයාගේ එකගත්ත්වය නොමැතිව නියමයක් නොකළ යුතු ය.

ආයතනයක් හෝ පුද්ගලයකු සම්බන්ධයෙන් නියමයන් පැනවීම.

56. පළාත් අධිකාරියේ සියලු සාමාජිකයන් නිලධාරීන් සහ සේවකයන් දණ්ඩ නිතී සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සදහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

පළාත් අධිකාරියේ සාමාජිකයන් නිළධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

57. පළාත් අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛන ගත ආයතනයක් ලෙස සළකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අධිකාරියේ අල්ලස් පනතේ අවස්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සළකනු ලැබිය යුතු බව.

58\. 1. වෙනත් යම් ලිඛිත විධිවිධානවලට පටහැනිව කුමක් සදහන්ව තිබුණ ද මේ ප්‍රඥප්තියේ විධිවිධාන උතුරු මැද පළාත තුළ බලපැවැත්විය යුතුය. තව ද මේ ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටළුවක් හෝ අනුකූලබවක් ඇති වුවහොත් මේ ප්‍රඥප්තියේ විධිවිධාන උතුරු මැද පළාත තුළ ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිබවා බලපැවැත්විය යුතු ය. ;

2. එසේ වුව ද ශ්‍රි ලංකා ආණ්ඩුවේ පාර්ලිමේන්තුව පනත් යටතේ දැනටමත් පවත්වාගෙන යනු ලබන හෝ ඉදිරියට පවත්වාගෙන යනු ලැබිය හැකි හෝ ක්‍රියා පටිපාටියකට බාධාවක් නොවනු පිණිස හෝ එය වඩා ඵලදයි වනු ඇතැයි හෝ විෂයභාර අමාත්‍යවරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක මෙම ආඥපනතේ ඊට අදළ විධිවිධාන හෝ සම්පුර්ණ ප්‍රඥප්තිය ද හෝ ක්‍රියාත්මක කිරීම තාවකාලික හෝ දින නියමයක් නැතිව හෝ අත්හිටවනු ලැබීමට විෂයභාර අමාත්‍යවරයාට හැකි ය. ;

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා අත්හිටවීම.

3. එසේ අත්හිටුවනු ලැබු විට හෝ එම අත්හිටවීමේ නියමය නැවත ඉවත් කරනු ලැබු විට හෝ ඒ බව ගැසට් නිවේදනයක් මගින් හා සිංහල හා දෙමළ ඉංග්‍රීසී යන භාෂා තුනෙන් පළවන දිනපතා පුවත්පත්වලින් අවම වශයෙන් එක බැගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

එසේ අත්හිටුවීම් ප්‍රකාශයට පත්කිරීම.

59\. 1. (අ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සළකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධ ; හෝ

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධානය පිට පළාත් අධිකාරියේ පළාත් පාරිසරික උපදේශක සභාවේ හෝ පාරිසරික අනුයෝජිත ආයතනයක සාමාජිකයන් හෝ පළාත් අධිකාරියේ යම් නිළධාරියෙකු හෝ සේවකයෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සළකනු ලබන මේ ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයින්ට නිලධාරියාට හෝ සේවකයාට විරුද්ධව කිසිම හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධාන අනුව කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරිය නොහැකි බව.

නඩු ගාස්තු අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු බව ලැබෙන මුදල් අරමුදලට බැරකළ යුතු බව

2. යම් අධිකරණයක් ඉදිරියෙහි පළාත් අධිකාරිය විසින් හෝ පළාත් අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩු සම්බන්ධයෙන් පළාත් අධිකාරිය විසින් කරනු ලබන යම් වියදමක් පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පළාත් අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ පළාත් අධිකාරිය විසින් අයකරනු ලබන යම් ගාස්තුවක් පළාත් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

පළාත් අධිකාරියේ නියමය පිට සත්භාවයෙන් කටයුතු කළ නිළධාරියෙකුට පැනවෙන දණ්ඩනයන් සඳහා ක්‍රියා කළ යුතු ආකාරය

3. 1 වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධානය පිට කරන ලද හෝ කරන ලදැයි සළකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ දී ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තිරණය කළහොත් ඒ වියදම් ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී අයකර ගනු ලැබුවේ නම් මිස පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රඥප්තියට අනුව නියෝග හා විධි විධාන කඩකරන්නන් හට දඩුවම් පැමිණවීම.

60. මෙම ප්‍රඥප්තිය යටතේ ඇති නියමයන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් විධිවිධාන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් හෝ ඒ විධිවිධාන හෝ නියෝග අනුව කටයුතු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ පැමිණවිය යුතු දඩුවමක් සඳහා විධිවිධාන සළස්වා නොමැති විටෙක උල්ලංඝණයක් හෝ පැහැර හැරීමක් කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ දී වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙආකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඩුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේය.

විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම.

61. 1. නියම කරනු ලැබිය යුතු යැයි ප්‍රඥප්තියේ ප්‍රකාශිත හෝ නියමිත හෝ මේ ප්‍රඥප්තියෙන් නියෝග සෑදීමට අවශ්‍ය සියලු කාරණා සම්බන්ධයෙන් විෂයභාර ආමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

2. විශේෂයෙන්ම හා 1 වැනි උපවගන්තියෙන් කරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(අ) 1. ඉදිකිරීම් හා සවිකිරීම්වලට හෝ යෝජිත ඉදිකිරීම් හා සවිකිරීම්වලට අදාළ පිඹුරු පිරිවිතර සහ තොරතුරු පරීක්ෂා කිරීම ;

2. මෙම පනත යටතේ බලපත්‍ර හෝ යම් විධානයක් නිකුත් කිරීම ;

3. අවශ්‍ය තතු පිරික්සීමේ සහ ඉටුකිරීම සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ;

(ආ) යම් ජාතික හෝ පළාත් පාරිසරික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හෝ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සහ වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම සඳහා ආරක්ෂා කිරීම සඳහා වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමිති හෝ උවමනා දැක්වීම ;

(ඇ) යම් ද්‍රව්‍යයක් ක්‍රියාවක් හෝ දෙයක් විෂ සහිත ද අහිතකර ද පිළිකුල් සහගත ද සෞඛ්‍යට හානිකර ද යන වග නැතහොත් මේ ප්‍රඥප්තියෙහි වෙනත් යම් විස්තරයක් අයත් වේද යනවග නිශ්චය කිරීමෙහිලා ප්‍රමිති හෝ උපමාන දැක්වීම ;

(ඈ) දියර ඝන හෝ වායු වන්නා වූ යම් ද්‍රව්‍යයක් හෝ විකිරණශීලී යම් ද්‍රව්‍යයක් පරිසරයට බැහැර කිරීම පිට කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම සහ යම් නිශ්චිත ඉන්ධනයක පාවිච්චිය තහනම් කිරීම හෝ එය විධිමත් කිරීම ;

(ඉ) අවට ඇති වායුවේ ගුණාත්මක ප්‍රමිති සහ පිට කිරීමේ ප්‍රමිති දැක්වීම සහ වායුගෝලයේ පැවතිය හැකි හෝ වායු ගෝලයට බැහැර කළ හැකි යම් ද්‍රව්‍යයක් එක් රැස්වීම උපරිම වශයෙන් ඉඩදිය හැකි ප්‍රමාණය දැක්වීම ;

(ඊ) දූෂණය සිදුවීමට සමත් යම් යන්ත්‍රයක් උපකරණයක් පහසුකමක් වාහනයක් හෝ බෝට්ටුවක් පාවිච්චි කිරීම තහනම් කිරීම නැතහොත් දූෂණය වැලැක්වීම හෝ අඩු කිරීම ඇතිවන පරිදි ඒවා තැනීම සවිකිරීම හෝ ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම ;

(උ) දූෂණය පිළිබඳ අනතුරු ඇඟවීම හෝ සෝදිසියෙන් සිටිමේ දැන්වීම් නිකුත් කිරීමේ අවශ්‍යතාව ;

(ඌ) කසල හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

(එ) පොලව මත හෝ ඇතුළත ඝන හෝ දියර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථාන පිහිටුවීම විධිමත් කිරීම ;

(ඒ) පීඩාකාරී ශබ්ද කවරේදැයි නිශ්චිත කිරීම හා මධ්‍යස්ථ ප්‍රමාණයේ වූ ශබ්ද සඳහා ප්‍රමිති දැක්වීම ;

(ඔ) සෞඛ්‍යට හෝ සුභ සාධනයට හානි කර විය හැකි වූ හෝ ප්‍රතිවිරුද්ධ සංස්කෘතික බලපෑම් ඇති වියහැකි වූ නැතහොත් දූෂණය වැලැක්විම සඳහා යම් ජල තීරයක හෝ ඒ අවට නෑම පිහිනීම බෝට්ටු පැදීම හෝ වෙනත් කටයුත්තක් කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

(ඕ) තෙල් අඩංගු වීමෙන් යම් පිටාර ගලා යාමක් අඩු කිරීම හෝ වැළැක්වීමේ කාර්යසඳහා නියම කරනු ලැබිය හැකි යම් උපකරණයක් ව්‍යාපාර කටයුතු කරගෙන යන තෙල් පිරිපහදු විසින් සවිකළ යුතු යැයි නියම කිරීම

(ක) පළාත් අධිකාරිය විසින් කරනු ලබන නිශ්චිත කිරීමකට විරුද්ධව වූ අභියාචනා වලට අදළ ව කාර්යය පටිපාටිය නියම කිරීම.

(ග) නගරබද හා ගම්බද දෘෂ්ටි ප්‍රසන්නතා ඇතිකිරීම සම්බන්ධයෙන් මාර්ග ඉඩම් හා ගොඩනැගිලි පවිත්‍රීකරණය අලංකරණය මනා පැවැත්ම සඳහා විධිවිධාන සහ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම විධිමත් කිරීම සහ ඉඩම් පරිහරණය හා කැබිලි කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියම කිරීම.

(ච) උපද්‍රවකාරී ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම.

(ජ) වායු ගෝලයට ජල තීරයට හෝ පසට හෝ වුව ද අපද්‍රව්‍ය සහ උපද්‍රවකාරී ද්‍රව්‍ය බැහැර කිරීම.

(ට) රුක් රෝපණය හා කැපීම ගෙවතු වගාව මුඩුබිම් වගාව සහ රුක් ගොමු පිහිටුවීම හා රුක් ආරක්ෂා කිරීම සහ නඩත්තුව.

(ඩ) සංවර්ධන නිලධාරියෙකු විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිශ්චිත කෘතිය පාර්ශ්වරුවකු විසින් නිශ්චිත පාරිසරික තතු පිරික්සීමේ කාර්ය ඉටුකිරීම නියම කිරීම.

3 විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

විෂයභාර අමාත්‍යවරයාගේ නියෝග *ගැසට්* පත්‍රයේ පළ කිරීම හා ක්‍රියාත්මක කිරීම.

4. විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම එය *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබුවා ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය. නියෝගයක් එසේ පරිච්ඡින්න වීමට පෙර ක්‍රියාත්මක කරනු ලැබ තිබුණේ නම් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් *ගැසට්* පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය.

62. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් ඒ සඳහා පහත නිර්වචනයන් සලකන්න.

'පරිසර ශබ්දය' යන්නෙන්, ඉඩම්, ජලය, පස හා වායු ගෝලය, දේශගුණය, දුර්ගන්ධය, රසය හා සෑම ආකාරයක සතුන්ගේ හා වටපිටාවෙහි භෞතික සාධක ද වේ.

'ඉඩම්' යන්නෙන් වාසස්ථාන, ගොඩනැගිලි සහ එයට සම්බන්ධ පරවශතාව හෝ සියලුම ආකාරයේ පදිංචි හෝ පදිංචියකින් තොරවූ භූමි භාගයක් සහ රජය සතු හෝ පෞද්ගලික යන සියලු (ඇල, දොල, ගංගා, දිය උල්පත්, ස්වභාවික ජල මාර්ග ඇතුලු සියලු වාරිමාර්ග වලට අයත්) ඉඩම් ඇතුළත් වේ.

'ගොඩනැගිලි' යන්නෙන් නිවසක්, කර්මාන්ත ශාලාවක්, තාප්පයක් හෝ ඕනෑම ඉදිකිරීමක් අදහස් වේ.

'පළාත් පාලන ආයතන' යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් හෝ ඒ වෙනුවට පිහිටුවන ලැබිය හැකි වෙනයම් ආයතනයක් හෝ සභාවක් ඇතුළත් වේ.

'දූෂණය' යන්නෙන් පරිසරය ඵලදයි ලෙස උපයෝගී කර ගැනීමට අහිතකර ලෙස හෝ මහජන ආරක්ෂාවට, සෞඛ්‍යට හෝ සුභ සාධනයට අහිතකර ලෙස හෝ වන සතුන්, කුරුල්ලන්, මත්ස්‍යන්, මනුෂ්‍යයන් හා ගහකොළ ශාක පැළෑටි ඇතුළු සියලුම ආකාරයේ ජීවීන් අතුරෙන් යම් කොටසකට හෝ සියල්ලට ම හෝ උපද්‍රවකාරී ලෙස හෝ බාධාවන ලෙස හෝ අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිට කිරීමෙන් බහා තැබීමෙන් හෝ තැන්පත් කර තැබීමෙන් පරිසරයට කිසියම් වු හෝ ආකාරයක අහිතකර බලපෑමක් ඇති කිරීම අදහස් වේ.

'ශබ්ද දූෂණය' යන්නෙන් කෝප ගන්වන හෝ වෙහෙසකර වු හෝ ඇසීම දුර්වල කරන වික්ෂිප්ත වීම මගින්, වෙනත් නාද හෝ ශබ්ද ඇසීමට බාධාකරන හෝ අවධානය බිඳ හෙලන අන්දමේ ශබ්දයක් හෝ නාදයක් සිදුකිරීම හෝ සිදුවීමට ඉඩ සැලසීම අදහස් කෙරේ.

'වායු දූෂණය' යන්නෙන් ශාක, පැළෑටි, ගහකොළ හෝ වන සතුන්, කුරුල්ලන්, මනුෂ්‍යයන් ඇතුළු ජෛවී සාධකයන්ට හෝ අජීවී වස්තූන්ට අනියම් විපාක ඇතිකරවන වාතයෙහි භෞතික, රසායනික හා ජෛවී ලක්ෂණයන් වෙනස් කරවන හෝ ආශ්වාස ප්‍රාශ්වාසයට බාධා කරවන හෝ අප්‍රසන්න ගන්ධයක් හෝ ධූමයක් හෝ අහිතකර අංශු සහිත වායුවක් පරිසරයට එකතු කිරීම අදහස් කෙරේ.

'අපද්‍රව්‍ය' යන්නෙන් පවිත්‍ර නොකළ මලමුත්‍රා, කැළිකසල, සත්ව හෝ ශාඛ කොටසක් කාර්මික හෝ කෘෂි කාර්මික විෂ රසායනික හෝ ව්‍යාපාරය සඳහා පාවිච්චියට ගත් ද්‍රව්‍ය හෝ ද්‍රව වල ශේෂ කොටස් සහ පරිසරයට සහ මහජන සෞඛ්‍යට අහිතකර වු හෝ අප්‍රසන්න ගන්ධයකින් යුත් වායු ද්‍රව හෝ ධූමයන් අදහස් කෙරේ.

'විෂ රසායනික ද්‍රව්‍ය' යන්නෙන් සජීවී ද්‍රව්‍ය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරවන්නා වු හෝ පරිසරයෙහි උපද්‍රවකාරී විපර්යාසයක් ඇතිකරවිය හැක්කා වු ද්‍රවයක් ද්‍රව්‍යයක්, හෝ ධූමයන් අදහස් වේ.

'ජලාශයන්' යන්නෙන් උතුරු මැද පළාතේ භූමි සීමාව තුළ පිහිටි ගංගා, වැව්, පොකුණු, ඇල මාර්ග, ළිං උල්පත් ආදී ඕනෑම ජල ගබඩාවක් අදහස් කෙරේ.

'විෂයභාර අමාත්‍යවරයා' යන්නෙන් උතුරු මැද පළාතේ පරිසර විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

'ලේකම්' යන්නෙන් පළාත් පාරිසරික අධිකාරියේ සහ පළාත් පාරිසරික උපදේශක සභාවේ ලේකම් හෙවත් සාමාන්‍යාධිකාරිවරයා හෙවත් එම ධූරය දරන නිළධාරියා අදහස් වේ.

'සභාපති' යන්නෙන් පළාත් පාරිසරික අධිකාරියේ සභාපති හෙවත් හෝ එම කාර්යභාර නිලධාරියා අදහස් වේ.

| | |
|---|---|
| 'අදාළ අමාත්‍යවරයා' | යන්නෙන් පළාත් පරිසර විෂයභාර අමාත්‍යවරයා අදහස් කෙරේ. |
| 'ක්‍රියාකාරී අධ්‍යක්ෂ' | පළාත් පරිසර අධිකාරියේ කාර්යයන් ඉටුකිරීමේදී මහජන සම්බන්ධතාව, සැලසුම් ක්‍රියාත්මක කිරීම ආදි කාර්යයන් හි දී සභාපතිවරයාගේ සහයට සිටින පූර්ණකාලීන ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකි. |
| 'උපදේශක සභාවේ අදහස්' | යන්නෙන් සම්පූර්ණ උපදේශක සභාවේ හෝ උපදේශක සභාවේ අනු කමිටුවේ හෝ විශේෂඥ දැනුමක් ඇති උපදේශක සභා සාමාජිකයෙකුගේ අදහස් යන්න හැඟවේ. |

07-230

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.